ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ගොඩනැගීමේ පටිපාටි - 4 වැනි පියවර

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ගොඩ නැගීමට මගපෙන්වීමක්

# විධායක අංශයේ නිර්මිතය

CPA
Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ගොඩනැගීමේ පටිපාටි

# විධායක අංශයේ නිර්මිතය

## හතරවැනි පියවර

පරිවර්තනය

**නීතිඥ එස්. ජී. පුංචිහේවා**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි

**විධායක අංශයේ නිර්මිතය**

ප්‍රථම මුද්‍රණය : **පෙබරවාරි 2016**

ISBN : 978-955-4746-60-2

පරිගණක සැකැස්ම : **වාකයා රූ දු.ඇ. 011-2708377**

මුද්‍රණය **: ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් දු.ඇ. 011-2329739**

ප්‍රකාශනය **: විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනය : 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05.

දුරකථන : 011 2370803 / 4

ෆැක්ස් : 011 2370801 / 2

වෙබ් අඩවිය : www.cpalanka.org

ඊමේල් : info@cpalanka.org

## පෙරවදන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ගොඩ නැගීම සම්බන්ධයෙන් ලොව පුරා පැවැත්වුණු පර්යේෂණයන්ගෙන් පසු ලියැවී ඇති පොත් පෙළකි.

"විධායක අංශයේ නිර්මිතය" මෙහි එන කරුණු අපේ රටට ද බෙහෙවින් පලදායක විය හැකි හෙයින් මෙසේ පරිවර්තනය විය.

**එස්. ජී. පුංචිහේවා**

09.02.2016

# 1. විධායක අංශයේ නිර්මිතය

## 1. හැඳින්වීම

විධායක අංශය ආණ්ඩුවක ප්‍රධාන අංශ තුනෙන් එකකි, එහෙයින් ආ.ක්‍ර. ව්‍යවස්ථා සැලැස්මකට මූලික වේ. බලතල වෙන් කිරීම සහ ආණ්ඩුවේ අංශ තුනේ අන්තර් සබඳතාව - විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය - එවැනි සැලැස්මක මූලික කරුණු වේ. පුළුල් හා පොදු හඳුනා ගැනීම අනුව ව්‍යවස්ථාදායකය නීති පනවයි, අයවැය ලේඛනය සම්මත කරයි. විධායකය එම නීති ක්‍රියාත්මක කරයි. අධිකරණය කරන්නේ එම නීති අනුව ආරවුල් විසඳීම ය. එහෙත් එම ආයතන තුන අතර සමබරතාව සැලැසුම් කිරීම් උදෙසා බොහෝ ගැටලුවලට පිළිතුරු සැපයිය යුතුව ඇත. නව ව්‍යවස්ථාවක් ගොඩ නැගීමේදී සංශෝධනය කිරීමේ දී හෝ එම ආයතන එකිනෙකින් කොතරම් වෙන් කළ යුතුද, ආයතන අතර බලතල ප්‍රමාණ කොතරම් දුරට පාලනය කළ යුතු ද යන කරුණ නිරන්තර විවාදයට ලක්වන කරුණකි. එහෙයින් විධායක අංශය පමණක් තනිකර ගෙන සාකච්ඡා කළ නොහැකි ය. එහෙත් එය ක්‍රියාත්මක වන ආණ්ඩු සැලැස්ම ගැන අවබෝධයක් ලබා ගැනීම අවශ්‍ය ය.

විස්තරාත්මකව විධායකය කෙරෙහි නිර්මිත විකල්පයන් සාකච්ඡා කිරීමට පෙර මෙම ආයතන තුනේ අන්තර් සබඳතාව ගැන කෙටි සමාලෝචනයක් කිරීම ප්‍රයෝජනවත් ය. විශේෂයෙන් ම, විධායක සහ ව්‍යවස්ථාදායක අංශයන් අතර ආයතනික සමබරතාව මගින් විවිධ පිළිවෙළවල් සහ සැලසුම් විකල්පයන් ලබා දෙනු ඇත. ව්‍යවස්ථාවන් අධ්‍යයනය කොට වාද විවාද කරන අය විවිධ වර්ගයේ ක්‍රම, වර්ග තුනකින් දක්වති; එනම්, ජනාධිපති ක්‍රමය, පාර්ලිමේනතු ක්‍රමය, ඒ දෙකේම අංග ලක්ෂණ සහිත මිශ්‍ර ක්‍රමය යනුවෙනි. ජනාධිපති ක්‍රමය පාර්ලිමේන්තු ක්‍රමය අතර මූලික වෙනස වන්නේ, ජනාධිපති ක්‍රමයක දී ව්‍යවස්ථාදායකය සහ ආණ්ඩුවේ ප්‍රධානි තනතුර යන දෙකම ඡන්දයෙන් තෝරාගනු ලබන්නේ නිශ්චිත කාලයකට වීමයි. පාර්ලිමේන්තු ක්‍රමයේ දී පාර්ලිමේන්තුව පමණක් එසේ තෝරා ගැනෙන අතර ආණ්ඩුවේ ප්‍රධානියා පාර්ලිමේන්තුව විසින් තෝරා ගැනෙන අතර එහි සහාය දිගටම අවශ්‍ය කරනු ඇත. මේ ක්‍රම අතර අනෙකුත් වෙනස්කම් ඇති කළ හැකි ඒවා ය. එම ආණ්ඩු ක්‍රමය අනුව අදහස් ද විවිධ වනු ඇත.

# 2. ආණ්ඩු වර්ග සහ ඒ සම්බන්ධ බලපෑම්

ප්‍රජාතාන්ත්‍රික ආ.ක්‍ර. ව්‍යවස්ථා ගොඩ නැගීම සහ ව්‍යවස්ථාමය සැලසුම් කිරීමේ දී ඇතිවන ප්‍රධාන ගැටලුවක් වන්නේ රාජ්‍ය ව්‍යුහය සකස් කිරීම ය.

සාමාන්‍යයෙන් ව්‍යවස්ථාවක, එයින් හැදෙන්නේ ජනාධිපති, පාර්ලිමේනතු හෝ මිශ්‍ර ක්‍රමයක් දැයි ප්‍රකාශ වන්නේ නැත. ඒ වෙනුවට ව්‍යවස්ථාවේ එහි ප්‍රධාන අංශ දෙකේ, විශේෂත්වය හා අන්තර්ගත සබඳතා සමබර කරන්නේ කෙසේදැයි සඳහන් වනු ඇත. දේශපාලන විද්‍යාඥයන් විසින් එය කුමන වර්ගයේදැයි හඳුවා දෙනු ලබයි. විවිධ විද්වතුන් එම ආණ්ඩු මාදිලි විවිධ පරාමිතීන් යටතේ අර්ථ කථනය කළ අතර සමහර රටවල් විවිධ කර්තෘවරුන්ට අනුව ඒවා වර්ග කර තිබිණ. මෙම අවිනිශ්චිත භාවය නිසා එක් ක්‍රමයක පවතින ශක්තීන් හා දුර්වලතා ගැන වාද විවාද කිරීම දුෂ්කර විය. එම අවදානම පිළිගනිමින් ම පහත ඡේදයන්හි දී එම විවිධ ක්‍රම කෙටියෙන් හඳුන්වා දෙන අතර පොදු දැක්මක් ලබා දෙනු ඇත.

## 2.1 ජනාධිපති ක්‍රමය

**සටහන 1. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ගති ලක්ෂණ**


ජනාධිපති ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ

විධායකය සහ ව්‍යවස්ථාදායකය ඡන්ද කොට්ඨාසය හා සම්බන්ධයක් නැති වීමයි. එහි ආරම්භය සහ පැවැත්ම එයින් වෙන්කර ඇත. (අවහිරතා වැළැක්වීමට ව්‍යවස්ථාවේ ක්‍රමවේදයක් නැත්නම් එම ආයතන දෙක අතර අවුල් ඇතිවිය හැකිය.)

- ජනාධිපති රාජ්‍යයේ මෙන්ම ආණ්ඩුවේද ප්‍රධානියා ය.
- ජනාධිපති මහජන ඡන්දයෙන් පත්කර ගනු ලැබේ. (සමහර විට අතුරු ආයතනයක් මගින් මනාප ගණන් ගනු ලැබේ.)
- ජනාධිපතිගේ ධූර කාලය සීමිත ය. (විශ්වාසය දිනා ගැනීම සඳහා ඡන්දයක් හෝ ප්‍රතිපාදනයක් නැත. ඔහු හෝ ඇය දේශපාලන වශයෙන් ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නැති අතර, ධූරයේ සිටීම සඳහා පක්ෂය සහයෝගය මත රඳා සිටින්නේ නැත.)
- කැබිනට් මණ්ඩලයට බලය ලැබෙන්නේ ජනාධිපතිගෙනි.
- නීති සෑදීමේදී බොහෝ විට ජනාධිපතිට දේශපාලන බලපෑමක් ඇතිවේ.

1. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක්

**ජනාධිපති ක්‍රමය**




## 2.2 පාර්ලිමේනතු ක්‍රමයක්


**සටහන 2 පාර්ලිමේනතු ක්‍රමයක ගති ලක්ෂණ**

ප්‍රධාන නිර්ණායකය වන්නේ බලතල සංයෝජනය කිරීමය. විධායකය, ඉහළ සිට පහළට ව්‍යවස්ථාදායකයට දෙවැනි වේ. එහෙයින් එහි ආරම්භය ද, පැවැත්ම ද ව්‍යවස්ථාදායකය මත රඳා පවතී.

- ආණ්ඩුවේ ප්‍රධානියා ව්‍යවස්ථාදායකය විසින් තෝරා ගැනේ.
- ආණ්ඩුවේ ප්‍රධානියා පාර්ලිමේනතුවට වගකීමට බැඳී සිටී. (විශ්වාසභංග යොජනාවකින්) එසේ ඔහුගේ හෝ ඇයගේ පක්ෂයේ සහයෝගය මත පවතී.
- සාමාන්‍යයෙන් රාජ්‍යයේ නායකයා (බොහෝ විට රජු හෝ නාමික ජනාධිපති) ආණ්ඩුවේ නායකයා නොවන්නේ ය.

රූපය 2 : පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක්

**පාර්ලිමේන්තු ක්‍රමය**




## 2.3 මිශ්‍ර ක්‍රමයක් (බොහෝ විට අර්ධ ජනාධිපති ක්‍රමයක් ලෙස හැඳින් වේ.)


**සටහන 3 : මිශ්‍ර ආණ්ඩු ක්‍රමයක ගති ලක්ෂණ**

මිශ්‍ර ක්‍රමයක ප්‍රධාන ලක්ෂණය වන්නේ විධායකයන් දෙකක් පැවතීම ය. විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර අන්තර් ක්‍රියාකාරී සබඳතාව එකතු කරයි.

- ජනාධිපති, එනම් රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් තෝරා ගැනේ.
- අගමැතිවරයා පත් කිරීමේදී හෝ අස් කිරීමේ දී ජනාධිපති හෝ ව්‍යවස්ථාදායකය සම්පූර්ණ පාලනය නොදරයි.
- (විශ්වාස භංග යෝජනාව අනුව) අගමැතිවරයා පාර්ලිමේන්තුවට වග කිය යුතු ය.
- සාමාන්‍යයෙන් ජනාධිපතිට යම් බලතල ප්‍රමාණයක් හිමි වේ.

රූපය 3 මිශ්‍ර ආණ්ඩු ක්‍රමයක්

**මිශ්‍ර ක්‍රමය**




## 2.4 විවිධ ආණ්ඩු ක්‍රමයන්හි ශක්තීන් හා අභියෝග

ව්‍යවස්ථා ගොඩනගන්නන් බොහෝ විට අපේක්ෂා කරන්නේ සාමය, ස්ථාවරභාවය සහ ප්‍රතිසන්ධානය ඇති කරන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාක් සැලසුම් කිරීමට ය. එසේම බලය අනිසි ලෙස නොයොදවන, වඩා යහපත් ආණ්ඩුවක් තෝරා ගැනීමට ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ඉඩ සැලසෙන පාලනයක් ඇති කිරීමට ය. ඉතා සුදුසු ආණ්ඩු ක්‍රමය මැන බැලිය යුත්තේ යම් ආණ්ඩුවක සාධනීය ක්‍රියා හා ප්‍රතිඵල අනුව ය. සැබැවින් ම එක් එක් ආණ්ඩු ක්‍රමයක ශක්තීන් හා අභියෝග ගැන බොහෝ පොත පත පළ වී ඇත. පහත සඳහන් 1 වගුවෙන් ඒ ඒ ආණ්ඩු ක්‍රමයන්හි ශක්තීන් හා අභියෝග විස්තර වේ.

විවිධ ආණ්ඩු වර්ගයන්හි ශක්තීන් හා අභියෝග

| | ශක්තීන් | අභියෝග |
|---|---|---|
| ජනාධිපති ක්‍රමය | **ඍජු රාජ්‍යපාලන බලය**<br>කෙලින්ම රාජ්‍ය පාලනය සඳහා වරම ලැබීම නිසා ජනතාවට ආණ්ඩුවේ නායකයාද, ව්‍යවස්ථාදායක නියෝජිතයන් ද කැමැත්ත අනුව තෝරා ගැනීමේ ඉඩ කඩ පැදේ. එසේම විධායකයට වගවීමේ යාන්ත්‍රණයක් ද එයින් ඇති වේ.<br><br>**ස්ථාවරභාවය**<br>පාර්ලිමේන්තු ක්‍රමයට වඩා ජනාධිපති ක්‍රමය මගින් ප්‍රතිපත්ති හැදීමේ ක්‍රියාවලියේ ස්ථාවර භාවයක් ඇත. ඉදිරියේ සිදුවන දේ දැකිය හැකි ය. පාර්ලිමේන්තු ක්‍රමය නිතර අස්ථාවර වීමෙන් හා නැවත නැවත හැදීම සිදුවේ. වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ද දේශපාලන ක්‍රමයක් ද අස්ථාවරය. | **ඒකාධිපතිත්වයට නැඹුරුවීම**<br>'ජයග්‍රහකයා සියල්ල අත්පත් කර ගනී' යන නියාමය යටතේ, ජනාධිපතිවරයකු බොහෝ විට තෝරා ගැනෙනුයේ සුළු ඡන්ද ප්‍රමාණයකිනි. එහෙත් ජාතිය සතු සියලු දේශපාලන බලතල සහිත පාලනය ඔහු සතු වේ. ඔහු සමස්ත ජාතියේ ම පාලකයා වුවද විපක්ෂය සමග විරසකයෙන් සිටිනු විය හැකි ය. එම හේතුව නිසා තම සතු බලය අනිසි ලෙස යෙදවීමට නැඹුරු වනු ඇත. නැවත ඡන්ද දිනා ගැනීමට යොමු වන අතර නීතියට ඉහළින් සිටීමට උත්සාහ දරනු ඇත. |

වගුව 1.

| | | |
|---|---|---|
| ජනාධිපති ක්‍රමය | බලය වෙන් කිරීම<br>විධායකය සහ ව්‍යවස්ථාදායකය සමාන්තර ආයතන වශයෙන් නියෝජනය වේ. එවිට එකක් අනිකෙන් පාලනය වේ. ප්‍රතිපත්ති විකල්පයන් ගැන සංවාද කිරීමට වැඩි නිදහසක් ඇති වේ. ආණ්ඩුවට විපක්ෂයේ තර්ජනයක් හා නව මැතිවරණ වලට මුහුණ පෑමේ අවදානම අඩු යි. | **දේශපාලන අවහිරතාවය**<br>ද්විත්ව බලයක් පැවතීම නිසා දේශපාලන අස්ථාවර භාවය ඇතිවිය හැකි ය. ජනාධිපතිට ඔහුගේ හෝ ඇයගේ වැඩ සටහන පාර්ලිමේන්තුවෙන් සම්මත නොවුණහොත් එම අවහිරතාවට පැමිණේ. |

වගුව 1

| | ශක්තීන් | අභියෝග |
|---|---|---|
| පාර්ලි-මේනතු ක්‍රමය | **පුළුල් අන්තර්ගත භාවය**<br>ගැටුම් වලින් භේදභින්න වූ සමාජයක පාර්ලිමේන්තු ක්‍රමය මගින් ඉතා පුළුල් ජන කොටස් ඇතුළත් කර ගැනීම සිදුවේ.<br>**නම්‍යශීලීභාවය**<br>ආණ්ඩුවේ ප්‍රධානියාගේ දේශපාලන වැඩ සටහන තුළ බහුතර ජනයාගේ අපේක්ෂා පිළිබිඹු නොවන්නේ නම් ඔහු හෝ ඇය වහා ඉවත් කර දැමිය හැකි ය.<br>**පලදායකත්වය**<br>විධායකයේ බලපෑමක් හෝ බාධාවක් නැති නිසා ව්‍යවස්ථාදායකයේ ක්‍රියාකාරකම් ඉක්මන් වේ. | **අස්ථාවරභාවය**<br>බහුතර ඡන්දයෙන් ආණ්ඩුව බිඳ වැටිය හැකි ය. සහාය ආණ්ඩුවලට නම්‍යශීලී අමාත්‍ය මණ්ඩල පවත්වා ගැනීම අසීරු ය.<br>**බලය වෙන් කිරීමේ අන්තර් පිළිවෙළක් නැතිවීම**<br>සමීප සබඳකම් නිසා පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුව විවේචනය නොකරනු ඇත. තමන් බලයෙන් පහ කරනු ලැබීමට එරෙහි ප්‍රතිපත්ති සකස් කිරීමට හැකියාවක් නැතිවනු ඇත. |
| මිශ්‍ර ක්‍රමය | **පුළුල් අන්තර්ගතභාවය**<br>විරුද්ධ බලවේග අතර බලය බෙදා හදා ගැනීමට මිශ්‍ර ක්‍රමයකට හැකි ය. එක් පක්ෂයකට ජනාධිපති ධූරය ද, තවත් පක්ෂයකට අගමැති ධූරයද බෙදීමෙන් | **ජය පරාජයෙන් තොර තරගකාරීත්වය ඇතිවීම**<br>ජනාධිපති හා අගමැති පක්ෂ දෙකකින් පත් වූ විට දෙදෙනාට සමානව නියෝජනය කිරීමට සිදුවේ. ඒ නිසා ජනතාව වෙනුවෙන් කතා කළ |

| | | |
|---|---|---|
| | ආයතනික වශයෙන්ද වෙනම ක්‍රියාත්මක විය හැකි ය. එහිදී අනෙක් ක්‍රම දෙකේම ශක්තීන් මීට එකතු විය හැකි ය. | යුත්තේ තමන්යයි දෙදෙනාම සිතන්නට පුළුවන.<br>මේ තත්වය උග්‍රවීමෙන් ඇතිවිය හැකි නරකම ප්‍රතිඵලය වන්නේ මේ ආණ්ඩු ක්‍රම දෙකේ නරකම ලක්ෂණ එකතැන් වීමයි. |

## 2.5

දේශපාලන ක්‍රමයන්ගේ ඉතා පුළුල් නාමාවලිය වර්ග තුනකට කැටිකොට දැක්විණ. එනම් ජනාධිපති ක්‍රමය, පාර්ලිමේනතු ක්‍රමය සහ ඒ අතරමැදි මිශ්‍ර ක්‍රමය වශයෙනි. ඒ එක් එක් ක්‍රමය ගැන නියත අර්ථ කථනයක් නැත.

රටකට අවශ්‍ය ස්ථාවර හා පලදායක ආණ්ඩු ක්‍රමයක් ගැන තීරණය කිරීමේ දී එක් ආණ්ඩු ක්‍රමයක් කෙරෙහි පමණක් අරමුණු කිරීම නොමග යවන සුලු ය.

ව්‍යවස්ථා ගොඩ නගන්නන් විසින් එම දේශපාලන මාදිලිවලින් විශේෂ එකක් කිසිවිට තෝරා ගන්නේ නැත. සැබෑ ලෝකයේ අවශ්‍යතාව වන්නේ ජනාධිපති ක්‍රමය හෝ පාර්ලිමේන්තු ක්‍රමය අතුරෙන් එකක් තෝරා ගැනීම නොවේ. ව්‍යවස්ථා ගොඩ නැගීමේ ක්‍රියාවලිය සඳහා වඩා වැඩදායී ක්‍රමයක් තෝරා ගැනීම ය.

# 3. අරමුණු / පුළුල් දැක්ම

මේ සම්බන්ධයෙන් ලියැවුණු පෙළපොත් අනුව, විධායකය ආණ්ඩුවක ප්‍රබල අංශ තුනෙන් එකකි. සාම්ප්‍රදායිකව එහි පැහැදිලි අරමුණ වන්නේ, ව්‍යවස්ථාදායකය පැන වූ නීති ක්‍රියාත්මක කිරීමත්, අධිකරණය විසින් ඒ නීතිය අර්ථ කථනය කිරීමත් ය. එහෙත් ප්‍රායෝගික වශයෙන් විධායකයට අසාමාන්‍ය බලයක් භාවිත කළ හැකි නිසා රටක ස්වභාවික පාලකයා ලෙස සැලැකෙන අතර දේශීය හා විදේශීය වශයෙන් රටේ ප්‍රතිරූපය ද ගොඩ නගනු ඇත. එහෙයින් රටක විධායක අංශය තෝරා ගැනීමේ දී බරපතල අසමගි තත්වයන් ඇතිවිය හැකි ය. විශේෂයෙන් වාර්ගික ගැටුම් ඇති වූ සමාජ පසුබිමක ය. මැතිවරණයක් වූ කලී ජයග්‍රාහකයන් සහ පරාජිතයන් වෙන් කරනු ලබන අවස්ථාවකි. බලයට පත් වන තැනැත්තා සිය සහායකයන් සමග එක් වී පරාජය වූ පක්ෂය මිතුරන් වශයෙන් නොසලකා ක්‍රියා කරනු ඇතැයි සැක කිරීම පුදුමයක් නොවේ. සැබැවින් ම ව්‍යවස්ථාවේ ඇති හෝ නැති විධායක බලය පුළුල් කර ගැනීමක් සමග ගැටුම් තවත් උග්‍ර විය හැකි ය.

කෙසේ වුවද ව්‍යවස්ථා ගොඩ නැගීමේ ක්‍රියාවලිය මුළුමනින්ම උගතුන්ගේ ක්‍රියා පටිපාටියක් නොවේ. එසේ වුවහොත් එය රටට අවශ්‍ය යයි සිතන යාන්ත්‍රික විසඳුමක්

වන්නේ ය. ව්‍යවස්ථාව කෙටුම්පත් කරන්නන්ද, කතිකා කරන්නන්ද, දේශපාලන ක්‍රියාකාරීන් නැත්නම් පක්ෂ වනු ඇත. ඔවුන්ට වුවමනා වන්නේ ඔවුන්ගේ න්‍යාය පත්‍ර ව්‍යවස්ථා අන්තර්ගතයට ඇතුළත් කිරීම ය. ඒ අනුව ව්‍යවස්ථා සැලසුම බොහෝ විට විවිධ ක්‍රියාකාරීන්ගේ අවශ්‍යතා අපේක්ෂාවන් නියෝජනය කරයි. විරෝධතා කරුවන් සහ හිංසාවට ගොදුරු වූවන් ඇතුළු ගැටුමකට පසු අයිතිවාසිකම් ක්‍රියාකාරීන් තමන්ටත් ඉඩකඩක් තිබිය යුතුයයි බලපෑම් කරනු ඇත. ඒ නිසා ව්‍යවස්ථා ගොඩ නගන්නන් බලාපොරොත්තු වන හොඳම ව්‍යවස්තාව ලබාගත නොහැකි වේ. එහෙත් ඉහළම එකඟතා ව්‍යවස්ථාවක් ලබාගත හැකි වනු ඇත. එහෙයින් ව්‍යවස්ථා සැලසුම් විවිධ ස්වරූප ගනු ඇත. ව්‍යවස්ථා ක්‍රියාවලිය කෙරෙහි බලපෑ හැකි බලවත් විධායකයක් ඇතිකරගත හැකිද යන ගැටලු මතුවේ.


විශේෂ සිද්ධීන් වලදී බලවත් ජාතික විධායකයක් තිබීමේ වාසි ඇතත්, ප්‍රචණ්ඩ ගැටුම් වලට එක් හේතුවක් වී ඇත්තේ, ටික දෙනෙකු බලතල කැටිකර ගැනීමෙන් බොහෝ දෙනෙකු කොන් කිරීමේ විධායකයන් පැවතුන විට ය. විධායක බලතල ලිහිල් කිරීමේ සැබෑම සත්‍යය වන්නේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට බොහෝ ක්‍රියාකාරීන් ඇතුළත් කර ගැනීම ය. එය එක්කෝ විධායක ක්‍රියාවලිය තුළ විය හැකිය, නැත්නම් තුලන හා සංවරණ ක්‍රමවේද මගින් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු තුළ විය හැකි ය. විධායක බලතල ක්‍රියාත්මක කිරීමට බොහෝ ක්‍රියා කාරීන් ඇතුළත් වීමෙන් හෙවත් විධායක ක්‍රියාකාරීත්වයේදී බලතල පාලනය වීමෙන් බලය නිෂේධ කළ හැකි ක්‍රියාකාරීන් වැඩිවනු ඇත. ඒ තීරණ ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද කිරීම ආදියෙනි. ඒ

අයුරින් පුළුල්ව ඇතුළත් කරගැනීමේ සහ සාර්ථක විධායක ක්‍රමයක් අතර සමබර සැලැස්මක් ඇතිකර ගත හැකි වනු ඇත.

4වැනි රූපයෙන් අවධාරණය වන්නේ විධායක සැලසුම් විකල්පයක් වශයෙන් විවිධ කොටස් දෙවර්ගයකට බෙදීමකි. පළමුවැන්න ආයතනික සැලසුම් විකල්පයන් කෙරෙහි යොමුවන අතර දෙවැන්න ආයතනික සැලසුම තුළ විධායකයට පැවරෙන මූලික බලතල ගැන යොමුවේ.

1. පළමුවැන්න යළිත් දෙකොටසකට බෙදේ. එනම්: විධායකය තුළ ආයතනික සැලැස්ම සහ විධායකය හා ආණ්ඩුවේ ශාඛා වන් අතර ආයතනික සැලැස්ම ය. විධායකය තුළ ආයතනික සැලැස්ම පරිමාණ දෙකකින් දක්වේ. තිරස් සහ සිරස් ය. තිරස් පරිමාණයෙන් විධායක සැලසුම් ලිහිල් කිරීමේ විකල්පයන් ඇතිවන්නේ ජාතික මට්ටමෙනි. එනම්: සාමූහික ජනාධිපති ධූර ඇති කිරීම, (ජනාධිපතිවරු එක්කෙනෙකුට වඩා සිටිති.) ද්විත්ව විධායකය (ජනාධිපති සහ අගමැති) සහ ජනාධිපති ධූර කාලය සීමා කිරීමෙනි. සිරස් පරිමාණයේදී, විවිධ විමධ්‍යගත කිරීම් මගින් විධායක බලය ආණ්ඩුවේ විවිධ මට්ටම් වලට බෙදා හැරේ. විධායකය තුළ ව්‍යවස්ථා සැලසුම් ළඟට ඉතා වැදගත් වන්නේ ආණ්ඩුවේ විවිධ අංශ අතර සබඳතා ය. බලතල වෙන් කිරීමේ සහ තුලන සංවරණ ක්‍රම සහිත පසුබිමක් යටතේ විවිධ ආණ්ඩු ක්‍රමයන්හි විධායකය කෙරෙහි විවිධ බලපෑම් ඇතිවේ. තවද, නිශ්චිත ආයතනික සැලසුම් විකල්පයන් මගින් විධායකයේ කාර්යයන් මැන බැලීමේ බොහෝ අවස්ථා ඇතිවේ. එසේ කිරීම නොයෙක් මට්ටමින් සිදුවිය හැකි ය.

2. විධායක බලතල කොතරම් දුරට නිත්‍ය ලෙස ඒකරාශී කරගත හැකි දැයි තීරණය වන්නේ ප්‍රධාන විධායකයාට පැවරෙන විශේෂිත බලතල අනුව ය. විධායකයට සාම්ප්‍රදායිකව පැවරෙන බලතල - එනම් : හදිසි තත්වය ප්‍රකාශ කිරීම, සමාව දීම, යුද්ධ ප්‍රකාශ කිරීම, සහ සාම්ප්‍රදායිකව විධායකයේ මැදිහත්වීම සමග ව්‍යවස්ථාදායකයේ බලතල අතර වෙන්කොට දැක්වීමක් තුළ හැකිය. ප්‍රධාන විධායකයාගේ ව්‍යවස්ථාදායක බලතල වන්නේ යම් ව්‍යවස්ථවෙන් සම්මත වූ පනත් කෙටුම්පත් නිෂේධ කිරීමේ යම් ප්‍රතිපත්ති කරුණු පිළිබඳ මූලිකත්වයක් දැරීම, ප්‍රකාශනයකින් නීතියක් පැනවීම, ජනමත විචාරණ කැඳවීම සහ අයවැය ලේඛණය හැඩ ගැස්වීම ආදියයි.


විධායක බලතල සහ ඒවා ලිහිල් කිරීම සඳහා වූ ව්‍යවස්ථාමය විකල්පයන්
විධිමත් (ආයතනික)
ස්ථාවර
ආයතනය තුළ (5.2)
විධායකය සහ ආණ්ඩුවේ අනෙක් ආයතන හෝ පුරවැසියන් අතර (5.3)
විධායක තීන්දු ගැනීමේ දී අනෙක් අංශවලට මැදිහත් වීම (5.4.1)
නීති සෑදීමේ ක්‍රියාවලියට විධායකය මැදිහත්වීම
තිරස්
සිරස්
සාමූහික විධායකය
● ද්විත්ව විධායකය
● ධූර කාල සීමාව
ආණ්ඩුවේ විවිධ මට්ටම්වල දී විධායක බලතල බෙදීම
● දෝෂාභියෝගය
● විධායකයට කැඳවුම් නියෝග කිරීමේ බලය
● පුරවැසියන් විසින් ප්‍රධාන විධායක ආපසු කැඳවීම
● ප්‍රධාන විධායක සහ නියෝජිතයන් ගැන ව්‍යවස්ථා දායකය විසින් ස්වාධීන පරීක්ෂණ පැවැත්වීම
● යුද්ධ ප්‍රකාශ කිරීම
● හදිසි අවස්ථා ප්‍රකාශ කිරීම
● සමාව ප්‍රදානය කිරීම
● විශේෂ නිලධරයන් පත් කිරීම
● නීතිමය බලය සහිත ප්‍රකාශ නිකුත් කිරීම
● නිෂේධ බලය
● ව්‍යවස්ථා සංශෝධන සඳහා මැදිහත්වීම

# 4. පෙළ යෙදුම

විශේෂිත ආකාර වල ව්‍යවස්ථා සැලසුම්වල කරුණු හා ප්‍රතිඵල සම්බන්ධයෙන් උපකල්පනයන් හා පුරෝකථනයන් සඳහා අසීමිතව පොතපත ලියැවී ඇත. ඒ දේශපාලන චරියාව මහජන ප්‍රතිපත්තිය, දේශපාලන ස්ථාවරභාවය සහ සමාජ ඒකාබද්ධතාව ආදිය ගැනයි. එහෙත් යථාර්ථය වන්නේ එම ක්ෂේත්‍රයේ පැහැදිලි පොදු මූලධර්මයන් වශයෙන් ඇත්තේ ඉතා ස්වල්පයක් බවයි. එක් කතෘවරයකු පැවසූ පරිදි මහා ගොඩක් වූ ව්‍යවස්ථා පුරෝකථන, අසාර්ථක වූ සහ බලාපොරොත්තු නොවූ ප්‍රතිඵල වලින් ගහනව පවතී. එසේ වූයේ බෙහෝ අනියත - දේශපාලන, ආර්ථික හා සමාජ බලපෑම්, ව්‍යවස්ථා අන්තර්ගතයට රිංගා ගැනීම නිසා ය. එහෙයින් එහි ප්‍රතිඵල ද වෙනස්විය. මෙම මූලධර්මයන් වෙනත් රටවල භාවිත කළ විට එම ප්‍රතිඵල ම නොලැබී ඊටත් වෙනස් වූ ප්‍රතිඵල ඇතිවිය හැකිය.

> නීතියේ සංගීතය වෙනස් වෙයි.
> එසේ වන්නේ තව දුරටත් එම සංගීත භාණ්ඩ සහ
> එම වාදකයන් නොවන විට ය.
> **Damaska Mirjan** යේල් විශ්වවිද්‍යාලයේ නීති මහාචාර්ය

ව්‍යවස්ථා දෙකක් හරියට ම සමාන නොවන නිසා, එකකින් ගත් පාඩම් අනිකකට වෙනස් වෙයි. තවත් මිනිස් කොටසකට හෝ සංස්කෘතික පසුබිමකට වෙනස්වේ. එකකින් ලබාගත් ආයතනික සැලසුම් තවත් එකකට හොඳින් ගැලපෙනවා විය හැකි වුවත් තවත් එකකට විනාශකාරී විය හැකි ය. ව්‍යවස්ථාවන්හි නීති සහ ප්‍රතිපත්ති ඇතුළත් විය හැකි ය. එහෙත් එසේ වීමෙන් පමණක් ඒවායින් සමාජය වෙනස් නොවේ.

# 5. සැලසුම් විකල්පයන්

## 5.1 ප්‍රජාතන්ත්‍රවාදී පසුබිමක මධ්‍යගත විධායකයකට සැලසුමක්.

මධ්‍යගත විධායක පාලනයක බලය ජාතික මට්ටමින් එක් පුද්ගලයකු වෙත කැටිවී පවතී. දේශපාලන වශයෙන් විධායකයේ ප්‍රධානියාගේ බලය ව්‍යවස්ථාදායකයෙන් පැමිණි එකක් නොවේ. ඔහු හෝ ඇය විශ්වාසභංග යෝජනාවකින් ඉවත් කළ හැකි නොවේ. තවද ඔහු හෝ ඇය වෙත කැබිනට් මණ්ඩලයේ පූර්ණ පාලනයද ඇත්තේ ය. එහෙයින් වාරික ඡන්ද විමසීමකදී හැර විධායක අංශයේ ප්‍රධානියා කෙරෙහි දේශපාලන අත්වැරදි චෝදනා යොමුවීම සීමිත ය. ව්‍යවස්ථාදායකයේ ප්‍රශ්න කරනු ලැබීමෙන් නිදහස් ය. විධායක ජනාධිපති ක්‍රමයේ ආයතන සැලැස්මෙහි මේ ගති ලක්ෂණ බොහෝ විට පිළිබිඹුවේ. කෙසේ වෙතත් මධ්‍යගත විධායකයන් ඇත්තේ ජනාධිපති ක්‍රමයක් පවතින රටවලම පමණක් නොවේ. අර්ධ වශයෙන් එසේ සිදු වන්නේ ආයතනික සැලසුම අනුව පමණක් නොව එම රටේ දේශපාලන පක්ෂ ශක්තිය හා නිර්මාණය අනුව (බලන්න 2.5) හෝ ආණ්ඩුවේ ඒකාධිපති ගුණාංග අනුව ය. අර්ධ වශයෙන් පාර්ලිමේන්තු ක්‍රමයේ පවතින බලය ඒකරාශී කරගැනීමේ ආයතනික ස්වරූප අනුව ය. එක් නිදසුනක්

නම් ඃ පාර්ලිමේන්තු ක්‍රමයක අගමැතිට කැබිනට් මණ්ඩලය කෙරහි කොතරම් දුරට විශේෂිත පාලනයක් තිබේද යනුයි. (බලන්න 5.3.2) මෙසේ පාර්ලිමේන්තු ක්‍රමයක මූලික ශක්තිය වන්නේ ව්‍යවස්ථාදායකය මත ආණ්ඩුවේ දේශපාලනය රඳා පැවතීම අනුව ය. එහි යම් ප්‍රමාණවත් වෙනසක් විය හැක්කේ කැබිනට් මණ්ඩලයේ පුද්ගල නියෝජනය අගමැතිගේ පූර්ණ වගකීම වන විට ය. ආයතනික සැලසුම් වලට අමතරව ප්‍රධාන විධායකයාට පැවරෙන කාර්ය භාරයන් අනුවද බලය ඒකරාශීවීම සිදුවේ. එනම් ඃ හදිසි තත්වය ප්‍රකාශ කිරීමේ බලතල කෙතරම් දුරට ලැබී තිබේද? (ඒ සමග ඔහුට පැවරෙන වෙනත් බලතල) සමාව ප්‍රදානය කිරීම, යුද්ධ ප්‍රකාශ කිරීම, ආදී බලතල විධායකයේ බලය පෙන්නුම් කරයි. ප්‍රධාන විධායකයාට නීති පැනවීමේ බලය තිබීමද එසේ ය.

බලවත් විධායකයත් තිබීම ස්වභාවයෙන්ම විනාශකාරී නොවේ. එමගින් ස්ථාවරභාවය ඇතිකොට භේද භින්න වූ සමාජයක් එක්තැන් කළ හැකි ය. (උදාඃ බ්‍රසීලය) තවද විධායකයට ප්‍රතිපත්ති ස්ථාවර කිරීමට හා දිගු කාලීන සැලසුම් පවත්වා ගැනීමට එම බලය යෙදිය හැකි ය. උදාඃ ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති බරක් ඔබාමා දැනට මුහුණ දෙන අභියෝගයක් ඇත. එනම් ඔහු ඡන්ද විමසීමේදී පොරොන්දු වූ යම් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේදී ව්‍යවස්ථාදායකයෙන් බාධා පැමිණීම ය. මේ නිසා ආණ්ඩුවේ අනෙක් අංශයන්හි නිෂේධ බලය සහිත නිලධරයන් පත් කිරීමේ අභියෝගයට ජනාධිපති මුහුණ දෙයි. බලවත් විධායකයට ඇති මූලික අභියෝගය විය යුත්තේ අත්තනෝමතික සහ ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනයට නැඹුරු

වීමේ සැලසුම් වැළැක්වීම ය. විධායක බලය නෛතික වැරදි වලින් නිදහස් වීමට තරම් අධිකරණ සබඳතා පැවැත්වීමත් පත්වීම් පටිපාටිය මෙහෙය වන විධායකයන් සමඟ සම්බන්ධ වීමත් නිසා අත්තනෝමතික පාලනයට නැඹුරු වීම වඩාත් අභියෝගාත්මක වෙයි.

ඊජිප්තුවේ ව්‍යවස්ථාව පසුගිය අවුරුදු 410 ක් තිස්සේ වර්ධනය වූයේ මධ්‍යගත විධායක අභියෝගයට මුහුණ දෙමිනි. පළමුව අත්තනෝමතික පාලනයකට එහි ඉඩකඩ සලසා තිබිණි. පසුව විධායකයේ වුවමනාවට ව්‍යවස්ථා සංශෝධන ඇතිවීමෙන් ආයතනික සමබරතාව නැතිවිය. 2007 ව්‍යවස්ථාවෙන් යළිත් ජනාධිපතිට විධායක බලතල පැවරුණේ ධූරකාලය සඳහා සීමාවක්ද නැතිව ය. (එහෙත් වචනයෙන් එය අර්ධ ජනාධිපති ක්‍රමයකියි හැඳින්විණි.) එයින් ඔහුට හෝ ඇයට ව්‍යවස්ථාදායකය අවශ්‍ය නම් විසුරුවා හැරීමේ බලය පැවරිණි. එසේම ව්‍යවස්ථාදායක සභාවට නියෝජිතයන් පත්කළ හැකි ය.

තවත් උත්තර මන්ත්‍රී මණ්ඩලයට තුනෙන් එකක් පත් කිරීමේ බලයද ඇත. ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමටය කියා නිෂේධ බලය යෙදිය හැකිය. එසේම සන්නද්ධ හමුදාවේ ද පොලිසියේද සේනාධිනායකයා ය. මෙවැනි තත්වයන් ඇති රටවල ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය කිරීමේදී විධායක බලතල ලිහිල් කිරීමේ ක්‍රමවේද ගැන අවධානය යොමු විය යුතුය.

## 5.2 විධායකය ඇතුළත ආයතනික බලතල ලිහිල් කිරීමේ විකල්ප සාධක.

විධායක බලතල බෙදා හැරීමේ ක්‍රමවේද දෙකක් ව්‍යවස්ථා කෙටුම්පත් කරන්නන් විසින් යෙදිය හැකිය.

(අ) තිරස්ව- සාමූහික විධායකයන් හෝ ද්විත්ව විධායකයන් පිහිටු වීමෙන්.

(ආ) සිරස්ව- ආණ්ඩුවේ අතිරේක බල පැවරීම් මගින්

## 5.2.1 සාමූහික විධායකයන්


රාජ්‍ය ප්‍රධානියාගේ හෝ විධායක ප්‍රධානියාගේ ආයතනයට තවත් විවිධ බලධාරීන් ඇතිවීමෙන් සාමූහික විධායකය ඇතිවේ. එහි ආකාර කීපයක් වේ. 2004 සූඩානයේ සාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ජනාධිපති, පළමුවැනි උප ජනාධිපති, දෙවැනි උප ජනාධිපති, ධූර ඇති කැරිණි. 2011 දී දකුණු සූඩානය නිදහස්වීමට පෙර සූඩානයේ ජනාධිපති මුළු රටේම නායකයා ය. එහෙත් සමහර තීන්දු ගැනීමේදී පළමුවැනි උප ජනාධිපතිගේ කැමැත්ත විමසා බැලේ. උප තනතුරු දෙකම ජනාධිපති පත් කළ යුතු වුවත් පළමුවැන්න උතුරේ විය යුතු අතර දෙවැන්න දකුණේ විය යුතුය. (දැන් ස්වාධීන දකුණු සූඩානයයි) පළමු වැන්නා ජනාධිපතිගේ ප්‍රදේශයේ නොවිය යුතු ය. පළමුවැනි උප ජනාධිපතිගේ ධූර කාලය තීරණය කරන්නේ ජනාධිපති නොව ව්‍යවස්ථාව ය.

බොස්නියා සහ හර්ෂ ගොවිනා ව්‍යවස්ථාව කෙටුම්පත් කළවුන් විසින් වඩා බලවත් සාමූහික විධායකයන් සැලසුම් කර ඇත. එහි විධායකයන් තිදෙනාටම සමාන බලතල හිමිවේ. (රූපය 5 බලන්න) ජනාධිපති ධූර වලට පත් වන්නේ ජනවාර්ගික පදනමින් ය. එක් දේශයකින් එක් කෙනෙකු බැගිනි. ඒ අනුව ක්‍රෝට් ජාතිකයකු, සර්බි ජාතිකයකු සහ බොස්නියා ජාතිකයකු වශයෙන් තිදෙනාගේ මණ්ඩලය සමන්විත වේ. එක් අයෙකු විදේශ කටයුතු සම්බන්ධයෙන් නාමික ජනාධිපති වශයෙන් ක්‍රියා කරයි. මේ තනතුර

මාරුවෙන් මාරුවට දැරිය යුතු ය. සමානයන් අතර ප්‍රමුඛයා යන න්‍යාය අනුව ය. සෑම තීන්දුවක්ම ඒකඟතාවෙන් ගත යුතු ය. බැරිම වුවහොත් බහුතරයෙනි. එහෙත් ඒකඟතාව ඉතා වැදගත් වන්නේ විරුද්ධ වන ජනාධිපති එම තීරණය තම ප්‍රදේශයට හානිකර යයි ප්‍රකාශ කළ හැකි නිසා ය. එවිට එම ප්‍රදේශ ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයාට එය තුනෙන් දෙකකින් පරාජය කළ හැකි ය.

සාමූහික විධායකයන් වර්ග දෙකම, වාර්ගික හේතුමත ඇතිවූ උග්‍ර සිවිල් යුද්ධ වලට පසු ඇතිවූ සාම සාකච්ඡාවන්හි

බොස්නියා සහ හර්ෂගොවීනාහි සාමූහික විධායකය.




රූපය 5

ප්‍රතිඵලයකි. (සූඩානය සම්බන්ධ 2005 දී ඇතිවූ විස්තීර්ණ සාම ගිවිසුම, බොස්නියාව සහ හර්ෂගොවීනා සම්බන්ධයෙන් 1995 දී ඇති වූ ඩේටන් සාම ගිවිසුම) ඒ දෙකේදීම, ඉහළම පෙළේ විධායක තනතුර නැතිව බල අතරමැදින්ට සාම ගිවිසුමකට පැමිණිය නොහැකි වනු ඇත. යුද්ධ කරන පාර්ශවයන් අතර එදිරිවාදීකම් අත්හැරීම කෙසේ වෙතත් යම් අතර මැදි එකඟතාවලට පැමිණීම ඉතා වැදගත් අභියෝග යක් විය. විශේෂයෙන්ම බොස්නියාව සහ හර්ෂගොවිනාව අතර පැවති අන්‍යොන්‍ය අවිශ්වාසය නිසා පොදු මාර්ග යකට පිවිසීම බාධාකාරී ය.

තුන්වැනි වර්ගයක සාමූහික විධායකයන් භාවිත වන්නේ ස්විට්සර්ලන්තයේ ය. (බලන්න රූපය 6) රටේ ඉහළම විධායක ආයතනය වන්නේ ෆෙඩරල් කවුන්සිලයයි. එය ජාතික ආණ්ඩුව වන අතර සාමූහික රාජ්‍ය නායකත්වයක් දරයි. ඊට සාමාජිකයෝ හත් දෙනෙක් සිටිති. ඔවුන් විවිධ භාෂා සහ ජන වර්ගයන් නියෝජනය කරමින් විවිධ පළාත් රාජ්‍ය (කැන්ටන්) පැමිණීම අනිවාර්‍යය වේ. එම ෆෙඩරල් කවුන්සිලයේ සාමාජිකයන් හත්දෙනා පුද්ගලයන් වශයෙන් තෝරා ගැනෙනුයේ ෆෙඩරල් මහා සභාව (ව්‍යවස්ථාදායකය) විසින් වසර හතරක ධූරකාලයකට ය. ඒ කාලය තුළ විශ්වාස භංග යෝජනා ඉදිරිපත් කළ නොහැකි ය. ඔවුහු සමානයන් ලෙස තෝරා ගනු ලැබෙති. එහෙත් වර්ෂයකට එයින් එක් තැනැත්තෙක් නාමික ජනාධිපති ලෙස ක්‍රියා කරයි. ෆෙඩරල් කවුන්සිලය එක් ආයතනයක් ලෙස තීරණ ගනී. සෑම කවුන්සිල් සාමාජිකයෙක්ම තම වෘත්තීය නිපුණතා අනුව එම ක්ෂේත්‍රයේ කටයුතු කරයි. ව්‍යවස්ථාවෙන් එසේ පනවා නැතත් 1959 සිටම ලොකුම පක්ෂ හතර

කවුන්සිලය නියෝජනය කරයි. මෙම විශිෂ්ට සන්ධානය පවතින්නේ ස්විට්සර්ලන්තයේ බලසම්පන්න ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙනි.

**ස්විට්සර්ලන්තයේ සාමූහික විධායකය.**

ෆෙඩරල් කවුන්සිලය

රාජ්‍ය නායකයා/ආණ්ඩුවේ නායකයා

සාමාජිකයන් 7 දෙනයි.

තීරණ ගැනීම බහුතර ඡන්දයෙනි.

ඡන්දයෙන් තෝරා ගැනේ.
(එක් රාජ්‍යයකට කැන්ටනයකට එක් සාමාජිකයා බැගිනි. භාෂා ජනකොටස් වෙනුවෙන් නියෝජනය)

ෆෙඩරල් මහා සභාව (ව්‍යවස්ථාදායකය)

ජාතික කවුන්සිලය (1 වැනි මන්ත්‍රණ සභාව) +
රාජ්‍ය සභා මණ්ඩලය( 2 වැනි මන්ත්‍රණ සභාව)

ඉහත දැක්වුණු උදාහරණ වලින් පැහැදිලි වන්නේ සාමූහික විධායකය විශේෂිත  ආණ්ඩු ක්‍රමයට සම්බන්ධ නැති බව ය. සූඩානයේ දී එය ජනාධිපති ක්‍රමය හා සම්බන්ධය. බොස්නියා - හර්ෂගොවීනා හිදී එය අර්ධ ජනාධිපති ක්‍රමයක් හා සම්බන්ධ ය. ස්වීට්සර්ලන්තයේදී සම්බන්ධ වන්නේ අර්ධ පාර්ලිමේන්තු ක්‍රමයකට ය.

### 5.2.2 දිවිත්ව විධායකය

ආණ්ඩුවේ නායකයා සහ රාජ්‍යයේ නායකයා යන ද්විත්ව විධායකය තිරස් ආණ්ඩු ක්‍රමයක් විය හැකි ය. ද්විත්වවිධායකය යන වචනාර්ථය සහිත, දිග කලක සිට

පැවතෙන ක්‍රමය ඉතාම ප්‍රචලිත ය. නිදසුනක් ලෙස, බොහෝ රටවල ආණ්ඩුවේ ප්‍රධානියා පාලන කටයුතු කරන අතර ප්‍රතිපත්ති සාදයි. රාජ්‍යයේ නායකයා, එනම් ජනාධිපති හෝ රජ, රාජ්‍යයේ චාරිත්‍රානුගත ප්‍රධානියා වශයෙන් ඉතා සුළු දේශපාලන බලයක් දරයි. (රාජ්‍ය නායකයා රජකම් කරයි, ආණ්ඩුවේ නායකයා පාලනය කරයි) පසුගිය දශක දෙක තුළ වඩා සමබර ලෙස හැඩ ගැසුණු ද්විත්ව විධායකයන් අර්ධ ජනාධිපති ක්‍රමයක් ලෙස හැඳින්විණ. අර්ධ ජනාධිපති ක්‍රමයක් තුළ ඇති ද්විත්ව විධායකය ස්වාධීන වූ, ව්‍යවස්ථාවෙන් පිළිගැනුණ ආයතනයෝ වෙති. අනියම් ලෙස තෝරා ගැනුණු ආණ්ඩුවේ ප්‍රධානියා හෙවත් අගමැතිවරයා යටත් වන්නේ ව්‍යවස්ථාදායකයේ බහුතර සහයෝගයට ය. අනික් නායකයා මහජන ඡන්දයෙන් තෝරා ගැනුණු රාජ්‍යයේ නායකයා හෙවත් ජනාධිපති ය. මෙම නායකයන් දෙදෙනාගේ බලතලයන්හි සමබරතාවය විවිධ තත්වයේ විය හැකිය. එම ද්විත්ව විධායකයේ බලතල එක් පැත්තකින් ජනාධිපති ක්‍රමය සමග අනික් පැත්තෙන් පාර්ලිමේන්තු ක්‍රමය එක්තැන් වීමකි. නිදසුනක් ලෙස ඊජිප්තුවේ 2007 ව්‍යවස්ථාවේ ආණ්ඩුව යනු අර්ථ කථනය වූයේ මුදුනේ සිටින අගමැතිවරයා සහිත අධීශ්වර විධායකය සහ රාජ්‍ය පරිපාලන ආයතනය වශයෙනි. එහෙත් ආණ්ඩුවේ ප්‍රමුඛ කාර්යය වන්නේ, එහි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ජනාධිපතිට සහාය වීමය යන කරුණු එම අර්ථ කථනයෙන් බැහැර කළ නොහැකි ය. සියලු වැදගත් ප්‍රතිපත්ති ගැටලු සම්බන්ධයෙන් අවසාන තීන්දුව රඳා පවතින්නේ ජනාධිපති වෙත ය. අගමැති පවා ජනාධිපතිගේ විශ්වාසය තබාගත යුතු ය. (එය ව්‍යවස්ථාදායකයේ අනුමැතියට පසු ය.) ඒ එක් පැත්තකි. අනික් පැත්තෙන්, අයර්ලන්තයේ කෙලින්ම තෝරා ගැනුණු ජනාධිපති වෙත පැවරෙන බලතල ඔහු විසින් ක්‍රියාත්මක කළ හැක්කේ ආණ්ඩුවේ උපදෙස් පරිදි වේ. එහෙත් සමහර අවස්ථාවන්හි දී ඔහුගේ පරම

අභිමානය අනුවයයි ව්‍යවස්ථාවේ සඳහන් වුවහොත් එසේ නොවේ. ඉහත සඳහන් විධායක නායකයන් දෙදෙනාගෙන් එක් අයකුට විධායකය තුළ නිෂේධ බලයක් හිමි නොවේ. වෙනත් බොහෝ රටවල විධායකයන් දෙදෙනාට බලතල පැවරීමේදී වඩා සමබර ක්‍රමවේද යොදා ඇත. නියමිත බලතල (එනම් ජනාධිපති හෝ ආණ්ඩුවේ බලතල) වලට අමතරව අගමැතිගේ හෝ කැබිනට් මණ්ඩලය පත් කිරීමට හෝ අස් කිරීමට ලැබෙන බලතල ඉතා තීරණාත්මක ය. මක්නිසාද, අගමැති ව්‍යවස්ථාදායකයට වගකිය යුතු නිසා ය. (5.3.1 බලන්න)

බලය බෙදී ගිය ද්විත්ව විධායකය කෙරෙහි විශ්වාසය තබමින් සමහර රටවල් මැතිවරණ තරඟ ගැටුම් සමනය කිරීමට අතුරු විසඳුමක් වශයෙන් සභාග ආණ්ඩු ඇති කැරිණි. 2008 දී කෙන්යාවේදීත්, 2008 දී ම සිම්බාබ්වේදීත් මෙම අතුරු විසඳුම යොදමින් විපක්ෂ නායක අගමැති වශයෙන් පත්කර ඇත. එහෙත් ජනාධිපති රාජ්‍යයේත් ආණ්ඩුවේත් නායකත්වය දැරී ය. සභාගයක හවුල් පාලනය කරනු වෙනුවට අගමැතිවරුන්ට යම් නිශ්චිත විධායක බලතල පවරා ජනාධිපති ක්‍රමය තුළට ගැනිණ.

1996 සහ 2001 කාලය තුළ ඊස්රායෙල් ආණ්ඩු ක්‍රමය මගින් ද්විත්ව විධායකය තෝරා ගැනීමට ප්‍රතිවිරුද්ධ ඡන්ද විමසීමක් යෙදිණ. එනම් රාජ්‍ය නායකයා (නාමික ප්‍රධානියා) ව්‍යවස්ථාදායකය මගින් තෝරා ගැනිණ. ආණ්ඩුවේ නායකයා (අගමැති) මහජන ඡන්දයෙන් පත්කර ගැනිණ. එය ව්‍යවස්ථාදායකය තෝරා ගැනීමත් සමඟ එක විට සිදුවිය. ඊස්රායෙල් ව්‍යවස්ථාදායකය භින්න වී තිබීම නිසා ස්ථාවර ආණ්ඩුවක් පිහිටුවීම අපහසුවිය. ඒ සඳහා අගමැතිගේ පක්ෂයද ශක්තිමත් නොවී ය. වෙනත් සුදුසු පසුබිම් වලදී මේ අසාමාන්‍ය ක්‍රමය වඩා ප්‍රශස්ත ලෙස භාවිත විය හැකි ය. එහෙත් ඊස්රායෙලයේදී එය සාර්ථක නොවී ය.

## 5.3.2 ජනාධිපති ධූර කාලය සීමා කිරීම

තනි පුද්ගලයකු වෙත විධායක බලය එකතුවීම ව්‍යවස්ථාවෙන් ම පාලනය කිරීමට කාල මානය යොදා ගත හැකි බව කෙනෙකුට සිතිය හැකි ය. ඒ ධූර කාලය සීමාවන්ට යටත් කිරීමෙනි. මතුපිට පෙනුමට එය පුරවැසි අවශ්‍යතාවය අනුව බලයේ සිටිය යුතු පුද්ගලයා තෝරා ගැනීමට ඇති ඡන්ද බලය සීමා කිරීමක් බව පෙනුණත්, එය ළදරු ප්‍රජාතන්ත්‍රීය රාජ්‍ය හෙවත් ඡන්දයෙන් පත්වුණ ඒකාධිපති පාලනයෙන් ප්‍රජාතන්ත්‍රීය පරිවර්තනයකට යාමට තිබෙන ඉතා වැදගත් උපක්‍රමයකි. සමහර කර්තෘවරුන් පෙන්වා දී ඇති පරිදි ධූර කාල සීමාව සහ නියත වාර මැතිවරණ පැවැත්වීම මගින් රාජ්‍ය බලය ලබා ගැනීමේ සහ නායකත්වය දිගින් දිගට තබා ගැනීම වැළකී ඇත. සනිටුහන් කළ යුතු කරුණක් ඇත. එනම්, ටියුනීසියාවේ සහ ඊජිප්තුවේ ව්‍යවසථාවන්හි එවැනි කාල සීමා නියමක් නැති බව ය.

ප්‍රධාන විධායක ධූරයෙන් එම පුද්ගලයා මාරු කිරීම විවිධ හේතු නිසා වැදගත් වේ. බැලු බැල්මට එයින් සීමා වන්නේ විධායකයා පාලනය කරන කාලසීමාව මිස, යම් කාල වකවානුවක ඔහුගේ හෝ ඇයගේ අධිකාරී බලය නොවේ. එසේ වුවද මෙසේ ධූර කාලය සීමා නොකර, ඔවුන්ගේ ඒකාධිකාරී බලය යොදමින් නැවත තෝරා ගැනීමේ මැතිවරණ පැවැත්වීම පෙලඹවීම පාලනය කළ නොහැකි ය. ධූර කාල සීමා කිරීම දෙවිධියකි. එක් ක්‍රමයක් නම් ධූරය එක දිගට දැරිය හැකි වාර ගණන සීමා කිරීම ය. රුසියාවේ සහ ඕස්ට්‍රියාවේ එක් දිගට ධූර කාල දෙකකට වඩා නොසිටිය හැකි ය. එහෙත් තවත් වාරයකට පසුව යළිත් තරග කළ හැකි ය. පැනමාහි යළිත් තරඟ කිරීමට එවැනි කාල සීමා දෙකක් පසුවිය යුතු ය. දෙවැනි වර්ගයේ සීමාවන්නේ යම් පුද්ගලයකුට වාර දෙකකට පසු කිසිසේත් යළිත් තරග කළ නොහැකිය යන දැඩි සීමාව ය. එසේ ම සමහර රටවල එක

ධූර කාලයක් පමණි. (උදාඃ පැරගුවේ, සහ දකුණු කොරියාව) වැඩි ගණනක් රටවල ඇත්තේ ධූර කාල දෙකේ සීමාව ය. (උදාඃ දකුණු අප්‍රිකාව, තුර්කිය.)

ජනාධිපතිගේ ධූර කාලය සීමා කිරීමේ වගන්තිය තරම් ලෝකය පුරාම, සංශෝධනය වූ, අවලංගු වූ, යළි අර්ථ කථනය වූ වෙනත් වගන්තියක් නැති තරම් ය. (උදාඃ ඇල්ජීරියාව, බෙලාරූස් බුර්කිනා ෆාසෝ, අයිවරි කෝස්ට්, ගැබොන්, කෂාක්ස්ථානය, නමීබියාව, පේරු, ශ්‍රී ලංකාව සහ උගන්ඩාව) ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියට ඒවා ප්‍රධාන යොමුවීම් ලෙස මැදිහත් වී නැතත් එම රටවල ජනාධිපති වරුන් විශේෂ ව්‍යස්ථා උපක්‍රම මගින් ඒ වෙනස් ඇති කර ගැනීමට සමත් වී ඇත. මෙම ප්‍රවණතාවන් පාලනය කිරීමට ව්‍යස්ථා සම්පාදකයන් විශේෂ ආරක්ෂණයන් යොදා ඇත. එල් සැල්වදෝරය, හොන්ඩියුරාස් සහ නයිජර් යන රටවල ජනාධිපති ධූර කාලය සම්බන්ධ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන වෙනස් කළ නොහැකි ය. හොන්ඩියුරාස් හි හමුදාව පවා වෙනස් කළ නොහැකි ය. දකුණු කොරියාවේ ව්‍යවස්ථාවේ ඊට වඩා වෙනසක් පවතී. ජනාධිපතිගේ ධූර කාලය සම්බන්ධ සංශෝධනයක්, සිටින ජනාධිපතිගේ ධූර කාලය සම්බන්ධයෙන් නම් ක්‍රියාත්මක නොවන්නේ ය.

### 5.2.4. විමධ්‍යගත කිරීම මගින් විධායක බලය ආණ්ඩුවේ විවිධ මට්ටම්වලට බෙදා හැරීම.

සාමූහික හෙවත් ද්විත්ව විධායක මාදිලිවලින්, ඉහළම මට්ටමේ ජාතික බලතල තනි පුද්ගලයකුගෙන් කීප දෙනකු වෙත බෙදා පැවරීමේ අවස්ථාව සැලසේ. එහිදී එක්ව තීරණ ගැනීම හෝ විවිධ බලතල විවිධ පුද්ගලයන් සතුවේ ඊට අමතරව හෝ විකල්ප වශයෙන් විධායක බලය තිරස් ආකාරයට ආණ්ඩුවේ විවිධ මට්ටම් අතරට බෙදා දිය හැකි ය. ආණ්ඩුවේ විධායක බලය වෙනස් මට්ටම් වලට (එනම්,

පළාත්, කලාප සහ ග්‍රාමීය වශයෙන්) පැවරීම තවත් ක්‍රමයකි. එවිට වැඩි දෙනකු විධායක ක්‍රියාවලියට සහභාගි වනු ඇත. පහළ මට්ටමේ සුදුසු නිලධාරීන් වෙත බලතල පවරා දීම මඟින් ජාතික මට්ටමේ බලය පහළට ගලායනු ඇත. ඇමරිකා එ.ජනපද ව්‍යවස්ථාව මගින් සමහර දණ්ඩ නීති ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ආණ්ඩු වලට පවරා ඇත. ඒ අනුව මරණ දඬුවම සම්බන්ධ සමාව අයැදීම් ප්‍රාදේශීය ආණ්ඩුකාරයන් වෙත ද පැමිණේ. එවිට ඒ සම්බන්ධයෙන් ඔවුන් තීරණ ගත යුතු ය. මේ අයුරින් ජනාධිපති වෙත තිබුණු බලයක් වෙනත් අයට පැවරී ඇත.

විමධ්‍යගත කිරීමේ ක්‍රම මගින් ද, විධායක බලය කෙරෙහි බලපෑම් කළ හැකි ය. එසේ බලය පැවරීමේ ප්‍රමාණය හා ස්වභාවය අනුව ප්‍රශ්න දෙකක් පැන නගී. ආණ්ඩුවේ අනෙක් මට්ටම් වලට පවරනු ලබන්නේ මොන වර්ගයේ වගකීම් ද? ජාතික විධායකය තමන් වෙත ඉතිරි කර ගන්නේ කෙබඳු පාලන බලතල ද? ආණ්ඩුවේ පහළ ස්තර වලට පැවරෙන ඉතා ප්‍රකට බලතල වන්නේ දණ්ඩ නීතිවල සිට පොලිස් බලතල දක්වා ය.

බලය විමධ්‍යගත කිරීමේ මූලිකාංග තුනක් වෙයි. එනම් පරිපාලන විමධ්‍යගත කිරීම, දේශපාලන විමධ්‍යගත කිරීම සහ රජයේ ආදායම් විමධ්‍යගත කිරීම යනු මධ්‍ය ආණ්ඩුවේ නොවන ආයතන වලට පවරා දෙන බලතල ප්‍රමාණයයි. දේශපාලන විමධ්‍යගත කිරීම යනු මධ්‍ය ආණ්ඩුවෙන් ප්‍රාදේශීය ආණ්ඩු වලට පැවරෙන දේශපාලන කටයුතු ප්‍රමාණයයි. එනම් නියෝජන තත්වයයි. රජයේ ආදායම් විමධ්‍යගත කිරීම නම්, මධ්‍ය ආණ්ඩුව විසින්, ප්‍රාදේශීය ආණ්ඩුවට රජයේ ආදායම් බලතල දෙන ප්‍රමාණයයි.

මේ විමධ්‍යගත කිරීම් සාර්ථක විය හැක්කේ ඒ තුනේ ම අන්තර් ක්‍රියාකාරිත්වයෙනි. පරිපාලන හා රජයේ ආදායම් විමධ්‍යගත කරණය, දේශපාලන විමධ්‍යගත කරණයට

සහාය වන්නේ නැත්නම් බලතල විමධ්‍යගත කිරීමෙන් පලක් වන්නේ නැත.

**පරිපාලන විමධ්‍යගත කරණය.**

මෙම ක්‍රමයේ ප්‍රභේද තුනක් ඇත. එනම්, වියෝජනකරණය, නියෝජන කරණය සහ බලය බෙදා හැරීම ය. තුනට වෙනස් ආකාර පරිපාලන බලතල ඇත.

බලය වියෝජනය ඇතිවන්නේ මධ්‍යම ආණ්ඩුව විසින් ක්ෂේත්‍ර නිලධාරීන් වෙත යම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් බෙදා දීමේදී ය. මෙහිදී අධිකාරිත්වය භූගෝලීය හෝ ක්ෂේත්‍ර වශයෙන් බෙදීමක් සිදු නොවන අතර වගකීම හා බලය මධ්‍යම ආණ්ඩුවේ පවතී. පහළ මට්ටමට සැබෑවටම බලය පැවරීමක් නැත.

නියෝජන කරණයේ දී ආණ්ඩුවේ ම තවත් මට්ටමකට පොදු කටයුතු කිරීම සඳහා බලය දීමක් සිදුවේ. මෙම නියෝජනය ස්වාමි සේවක සබඳතාවක ස්වරූපය ගනී. මධ්‍යම ආණ්ඩුව ස්වාමියා ද, පළාත් ආයතනය සේවකයා ද වේ ඒ පිළිබඳ අධීක්ෂණ බලයේ ප්‍රමාණය විවිධ වේ. සමහර විට නිත්‍ය පාලනයක් තිබිය හැකි ය. ඉතා සුළු ප්‍රමාණයේ අභිමතයක් පැවරිය හැකි ය. අනික් අතට ඒ සමගම විධිමත් මග පෙන්වීම් වලට අවනත වන බවට බල කෙරෙමින් මධ්‍යම ආණ්ඩුව විසින් ප්‍රාදේශීය ආණ්ඩු වෙත, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ පරිපාලන බලතල මුළුමනින් පැවරීම ද සිදුවිය හැකි ය.

විමධ්‍යගත කරණයේ බලවත් ම අංශය වන්නේ බලය බෙදා ගැනීම ය. එහි දී ප්‍රාදේශීය හෝ කලාප ආණ්ඩුවලට ආණ්ඩුවේ බලතල ප්‍රමාණයක් පැවරේ. යම් විශේෂිත ප්‍රදේශයකට එම බලය ක්‍රියාත්මක කිරීමේ අභිමතයක් සහිතව එම බලය පැවරේ. එවිට එය ස්ව පාලනයක් ලෙස පෙනී යා හැකි ය. එහෙයින් ප්‍රාදේශීය ආණ්ඩුව ව්‍යවස්ථාදායක

බලයක් භාවිත කරනු ඇත. එවිට නීති රෙගුලාසි හා ප්‍රතිපත්ති උපාය මාර්ග භාවිත වේ. එසේ වන්නේ මධ්‍යම ආණ්ඩුව පවරා දී ඇති බලතල ප්‍රමාණය අනුව ය. මධ්‍යම ආණ්ඩුව ඊට මැදිහත් වන්නේ සීමිත ප්‍රමාණයකට පමණි. මේ බලය බෙදා ගැනීමත් සමඟ දේශපාලන විමධ්‍යගත කරණයද සිදුවිය හැකි ය. ඒ අනුව මධ්‍යම ආණ්ඩුවට එම ප්‍රාදේශීය ආණ්ඩුව වගකීමෙන් බැඳ තැබිය නොහැකි ය. ඡන්ද විමසීමක දී මැතිවරණ කොට්ඨාසය එම වගකීම දැරිය යුතු ය.

### දේශපාලන විමධ්‍යගත කරණය

මෙයට මූලිකාංග දෙකක් වේ. (අ) නියෝජිතයන් පත් කිරීමේ බලය පැවරීම සහ මධ්‍යම ආණ්ඩුවෙන් ප්‍රදේශීය ආණ්ඩුවට දේශපාලන නායකත්වය පැවරීම (ආ) ප්‍රාදේශීය මට්ටමින් ආණ්ඩුවේ පාලනය සැලසුම් කිරීමේ බලය පැවරීම. මෙහි පළමුවැන්න මැතිවරණ විමධ්‍යගත කරණය වශයෙන් කෙනෙකුට හැඳින්විය හැකි ය. මක්නිසා ද, ප්‍රාදේශීය පාලනයට නියෝජිතයන් තෝරා ගනු ලබන්නේ ආණ්ඩුව නොව පුරවැසියන් විසින් නිසා ය. එසේ වුවද, එම නියෝජිතයන්ට ප්‍රතිපත්ති කෙරෙහි බලපෑම් කළ හැක්කේ මඳ වශයෙනි. එම නියෝජිතයන් ක්‍රියාත්මක කළ යුත්තේ ජාතික නියමයන් ය. එහෙයින් පුරවැසියන් විසින් මේ නියෝජිතයන්ට බලපෑම් කළ හැක්කේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නොව ක්‍රියාත්මක කිරීම ගැනය.

දෙවැනි මූලිකාංගය සඳහා අවශ්‍ය වන්නේ ප්‍රාදේශීය පාලකයන් තෝරා ගැනීමට ඡන්ද දායකයන්ට ඉඩ සැලසීමට අමතරව ව්‍යුහාත්මක සැලසුම් ක්‍රියාත්මක කිරීමත් දේශපාලන නායකත්වය බල ගැන්වීමත් ය. එනම්, ජාතික මධ්‍යස්ථානයෙන් පැවරෙන ප්‍රතිපත්ති කාරණා විධිමත්ව සැකසීම, මෙහෙයවීම සහ ඇගැයීම ය. එබඳු ක්‍රියාවක් සඳහා

ඉහළ මට්ටමේ ප්‍රාදේශීය ස්වපාලනයක් ද ව්‍යවස්ථාදායක බලයක් හෙවත් අර්ධ ව්‍යවස්ථාදායක ආයතනද තිබිය යුතු ය.

**රජයේ ආදායම් විමධ්‍යගත කරණය**

පරිපාලන විමධ්‍යගත කරණය ආණ්ඩුවේ වගකීම් භාරය කෙරෙහි යොමුවන අතර දේශපාලන විමධ්‍යගත කරණයෙන් ඉහත වගකීම් ක්‍රියාත්මක කිරීමේ දී ස්වපාලන බලයක් යොදයි. රජයේ ආදායම් විමධ්‍යගත කරණයෙන් රජයේ ආදායම් පිළිබඳ අධිකාරිත්වයක් දරයි. ප්‍රමාණවත් සම්පත් නැතිව කලාපීය හෝ ප්‍රාදේශීය ආයතන වලට කමන් වෙත පැවරුණු කාර්යයන් සාර්ථක ලෙස ඉටුකළ නොහැකි ය. එවිට එහි වගකීම සහ නීත්‍යානුකූල භාවය දුර්වල වෙයි. ආදායම් විමධ්‍යගත කරණයක් නැත්නම් අනෙක් විමධ්‍යගත කරණයන් ද අසාර්ථක වනු ඇත.

ජාතික සහාය නිලධාරීන් පත් කිරීමෙන් ජාතික විධායකයට එම ආණ්ඩුවල පාලනයට මැදිහත් විය හැකි ය. ඇෆ්ඝනිස්ථානයයේ සහ ඉන්දියාවේ ජනාධිපති ප්‍රාදේශීය ආණ්ඩුවල ප්‍රධාන විධායක නිලධාරියා පත් කරයි. ඝානාවේ, ප්‍රාදේශීය හා ග්‍රාමීය ජාතික අමාත්‍යංශය, දිස්ත්‍රික් විධායක නිලධාරීන් නම් කරයි. ජනාධිපති පත් කිරීම සිදු කරන අතර දිස්ත්‍රික් සභාව තුනෙන් දෙකේ ඡන්දයකින් එය සම්මත කරයි. තවද, ජනාධිපති දිස්ත්‍රික් සභාවේ සාමාජිකයන්ගෙන් සියයට තිහක් පත් කරයි. මෙසේ රාජ්‍ය වියදම් සඳහා පත් කිරීම සමග ම කාර්යභාරයන් ද පැවරේ.

## 5.3 විධායකය කෙරෙහි ආයතනික පාලනය

ආණ්ඩුවේ අනෙකුත් ආයතන විසින් පාලන ක්‍රමවේදයක් සැලසුම් කිරීම විධායකය පාලනය කිරීමේ එක් ක්‍රමයකි. ආයතනික ක්‍රම දෙකකින් මෙය සිදු කළ හැකි ය.

පාර්ලිමේනතු ක්‍රමයෙන් සහ ද්විත්ව විධායක ක්‍රමයෙනි. දේශපාලන අධිකාරිත්වය සහ ආයතන දෙකේම බලය පවත්වා ගැනීමට විධායකයට ව්‍යවස්ථාදායකය වෙන් කළ නොහැකි ය. පාර්ලිමේනතු ක්‍රමයේ දී විධායක අධිකාරිත්වය (අ) පැන නගින්නේ ව්‍යවස්ථාදායක ආයතනයෙනි. (ආ) එසේම ආණ්ඩුව ඉවත් කළ හැකි විශ්වාසභංග යෝජනා සම්මතයකට යටත් වේ. මෙම ගතිකයන්ගෙන් නිර්මාණය වන්නේ ව්‍යවස්ථාදායකයේ වාසියට ඉහළින් පහළට ධූරාවලීගත සම්බන්ධතාවකි. විධායකයේ බලය තව දුරටත් පාලනය කිරීමට ව්‍යවස්ථාදායකයේ කැබිනට් මණ්ඩල සංයුතියට පුළුවන. අර්ධ ජනාධිපති ක්‍රමයක් සහිත ද්විත්ව විධායකයකට, විධායකය ස්වාධීන දෙකොටසකට බෙදිය හැකි ය. ව්‍යවස්ථානුකූලව ද එය පිළිගැනේ. එනම් අනියම් ලෙස තෝරා ගැනුණු ආණ්ඩුවේ නායකයා හෙවත් අගමැති, ව්‍යවස්ථාදායකයේ බහුතරයට යටත් කිරීමෙනි, රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් තෝරා ගැනීමෙනි.

විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ අධිකාරී බලය සැබෑ ලෙස සමබර කිරීම විවිධාකාර විය හැකි ය. විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ බලය පාලනය කිරීමේ මට්ටම ගැන දර්ශක හතරක් වේ. එනම්, (අ) ද්විත්ව විධායකයක ආණ්ඩුවේ නායක, (අගමැති) පත් කිරීමේ, තෝරා ගැනීමේ සහ අස් කිරීමේ අධිකාර බලය; (ආ) ඇමති මණ්ඩලය කෙරෙහි පාලන බලයක් තිබීම; (ඇ) විශ්වාසභංග යොජනාවක් / දෝෂාරෝපණ යෝජනාවක් ඉදිරිපත් කිරීමේ හැකියාව; (ඈ) ව්‍යවස්ථාදායකය විසුරුවා හැරීමේ බලය.

### 5.3.1. ආණ්ඩුවේ නායකයා (අගමැති) පත් කිරීමේ, තෝරා ගැනීමේ සහ අස් කිරීමේ බලය.

බොහෝ ව්‍යවස්ථාවන්හි විකල්ප වශයෙන් යොදා ගැනුණු ද්විත්ව විධායක ක්‍රමය අනුව ජනාධිපති විසින් අගමැති තෝරාගත හැකි ය. (උදාඃ ප්‍රංසය, මොංගෝලියාව,

මොසැම්බික්, නමීබියා, පේරු, පෝලන්තය, රුසියාව, සෙනෙගල්) තවත් සමහර රටවල ජනාධිපති හෝ පතිනියගේ අභිමතය සීමා කර ඇත. එනම් සමූහාණ්ඩුවේ මන්ත්‍රී මණ්ඩලයේ අදහස විමසිය යුතු බවට ව්‍යවස්ථාවේ සඳහන් වේ. එසේම මහ මැතිවරණයේ ප්‍රතිඵල ද සලකා බැලිය යුතු ය. (උදා: පෘතුගාලය) බොහෝ විට අගමැති ඉවත් කිරීමේ බලය විශේෂයෙන් ඇත්තේ ව්‍යවස්ථාදායකට ය. (උදා: ප්‍රංසය, පෘතුගාලය, සෙනෙගල්) ඒ හේතුවෙන් තම තනතුර මත තෝරා ගැනීමේ හැකියාව ඇති බව ඔහුට හෝ ඇයට සහතික විය නොහැකි ය. තම කැමැත්තෙන් තෝරා ගැනීමෙන් ඔහු හෝ ඇය වළක්වා ඇති බැවින් ඔහු හෝ ඈ විසින් කළ යුත්තේ ව්‍යවස්ථාදායකයේ වැඩි සහයෝගය ඇති තැනැත්තා හෝ තැනැත්තිය තෝරා ගැනීම ය. තවද අගමැති වශයෙන් කෙනකු තෝරා ගැනුණු පසු තව දුරටත් ඔහු හෝ ඈ ජනාධිපතිට යටත් නැත. එහෙත් ව්‍යවස්ථාදායකයට යටත් ය. එහෙයින් ව්‍යවස්ථාදායකය සමග ආණ්ඩුවේ ප්‍රතිපත්ති කෙරෙහි නැඹුරු වන්නට සිදු වේ. සමහර ව්‍යවස්ථාවන්ගෙන් මේ ගතිකය මගහැර ජනාධිපතිගේ තත්වය ශක්තිමත් කර ඇත්තේ අගමැති ඉවත් කිරීමේ අභිමතය පැවරීමෙනි. (උදා: මොසැම්බික්, නමීබියා, පේරු සහ රුසියාව) ඒ නිසා අගමැති දෙපැත්තෙන් තෙරපෙන තත්වයට පත් වේ. එසේම ජනාධිපති සහ ව්‍යවස්ථාදායකය හා ඔවුන්ගේ දේශපාලන උපක්‍රම මත රඳා පවතින්නට අගමැතිට සිදුවේ.

පාර්ලිමේන්තු ක්‍රමයන්හි වුවද අගමැති තෝරා ගැනීමේ ක්‍රම විවිධ ය. එම ධූරයට කෙනකු පත්වීම අවසාන වශයෙන් රඳා පවතින්නේ ව්‍යවස්ථාදායකය මත ය. සමහර රටවල කෙලින් ම ව්‍යවස්ථාදායකයෙන් තෝරා ගැනේ. උදා: ස්වීඩනයේ කථානායක අගමැති ධූරයට කෙනෙකුගේ නම යෝජනා කරයි. තවත් රටවල අගමැති ධූරය නම් කරනු ලබන්නේ ජනාධිපති විසිනි. ඒ අතර ඊට වැඩි සහයෝගයක් නොලැබුනොත් ව්‍යවස්ථාදායකයෙන් කෙනකු නම් කරනු

ඇත. උදා: ජර්මනිය එවිට ජනාධිපති විසින් ඔහු හෝ ඈ පත් කරනු ලැබිය යුතු ය. වෙනත් ව්‍යවස්ථාවන්හි පක්ෂයේ වැඩිම සහයෝගය ලබන අයකු ජනාධිපති විසින් පත් කරනු ඇත. උදා : ග්‍රීසිය, තවත් රටවල ව්‍යවස්ථාදායකයෙන් තෝරා ගනු ලබන අයකු පත් කිරීමේ වගකීම ව්‍යවස්ථාවෙන් ම පැවරේ. (ජපානය) එම නීතිය අනුව, ජනාධිපති විසින් පත් කිරීම සිදු නොකැරුණ ද, යම් නියමිත කාලසීමාවක දී ඉබේම පත් වනු ඇත.

### 5.3.2 ඇමති මණ්ඩලය පාලනය කිරීම

විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර නිසි බලපෑම් ඇති කිරීමේ එක් මාර්ගයක් වශයෙන් අමාත්‍ය මණ්ඩලය පාලනය කිරීම භාවිත වේ. බොහෝ ජනාධිපති ආණ්ඩුක්‍රමයන්හි අමාත්‍ය මණ්ඩලය පත් කරන්නේ ජනාධිපති ය. එහෙයින් ඔහුගේ හෝ ඇයගේ කැමැත්ත අනුව සේවය කළ යුතු ය. එසේ වුව ද ජනාධිපති ක්‍රම කීපයක ව්‍යවස්ථාදායකය අමාත්‍ය මණ්ඩලයේ සංයුතියට දේශපාලන බලපෑම් කිරීමේ අවස්ථාව ලබයි.

උදා: කොලම්බියාවෙහි ඇමති වරුන් තනි තනිව ව්‍යවස්ථාදායකය මගින් වාරණය කළ හැකිය. ආර්ජන්ටිනාවෙහි එම වාරණය ඇමති මණ්ඩල ප්‍රධානියා කෙරෙහි යෙදිය හැකිය. ද්විත්ව විධායකයන්හි, කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් තෝරා ගැනීම අස් කිරිම යන කරුණු වලදී ජනාධිපති අගමැති සහ ව්‍යවස්ථාදායකය අතර ප්‍රායෝගික සමබරතාවයක් පවත්වන්නේ කෙසේද යනු අභියෝගයකි.ප්‍රංශ ව්‍යවස්ථාව අනුව පත්කළ යුතු හෝ අස්කළ යුතු ඇමතිවරුන් ගැන අගමැති විසින් ජනාධිපතිට නිර්දේශ කළ විට ජනාධිපති තීරණය කරයි. පාර්ලිමේන්තුවේ විශ්වාසය භංග යෝජනාවක් බලපෑම් කරන නමුත් එය පුද්ගල සංයුතිය කෙරෙහි නොවේ. පේරු රාජ්‍යයේ ව්‍යවස්ථාදායකයට අමාත්‍ය මණ්ඩලයේ පුද්ගලයන්

වාරණයට බලය ඇත. එමගින් අගමැතිගේ තත්වය දුර්වල කළ හැකිය. මොන්ගෝලියාවේ ජනාධිපති විමසීමෙන් පසු අගමැති අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය යෝජනා කරයි. අනතුරුව පාර්ලිමේන්තුව පුද්ගලයන් වශයෙන් අනුමත කරනු ඇත. එසේම අමාත්‍ය මණ්ඩල සැලසුම කෙරෙහි බලපෑමක් පසු ව්‍යවස්ථාදායකය විසින් විධායකයේ දිශාව යොමු කරයි.

1994-6 දකුණු අප්‍රිකා අතුරු ව්‍යවස්ථාව වෙනස් මගක් ගත්තේ ය. එනම් ව්‍යවස්ථාදායකයේ සංයුතිය විසින්ම විධායකයේ සංයුතිය තීරණය කැරිණි. ජනාධිපති තෝරා ගැනුණේ එම ඇමති මණ්ඩලයෙනි. ව්‍යවස්ථාදායකයේ මුළු ආසන සංඛ්‍යාවෙන් සීයයට පහකට වැඩි ආසන ලැබූ පක්ෂයටත් අමාත්‍ය ධූරයක් හිමිවේ. එහි පරමාර්ථය වුයේ වර්ණභේද වාදී පාලනයෙන් පසු ඉතා පුළුල් සහභාගිත්වයෙන් යුක්ත ආණ්ඩුවක් හැදීම ය.

### 5.3.3 විශ්වාස භංග යෝජනාව

දේශපාලන පසුබිම අනුව ව්‍යවස්ථාදායකයට ආණ්ඩුවේ ප්‍රධානියා වාරණය කිරීමට ඇති බලය විවිධ ගතිකයන් ඔස්සේ යොමුවිය හැකි ය. ව්‍යවස්ථා කීපයකම අගමැති කෙරෙහි ව්‍යවස්ථාදායකයේ විශ්වාසය පාලනය කිරීමේ ක්‍රමවේද හඳුන්වා දී ඇත. රුසියාවේ ජනාධිපතිට පාර්ලිමේන්තුවේ එවැනි යෝජනා සම්මතයක් ප්‍රතික්ෂේප කළ හැකි ය. එහෙත් මාස තුනකට පසු එය විශ්වාස භංග යෝජනාවක් ලෙස ඉදිරිපත් විය හැකි ය. නියමිත කාලසීමාවකට පසු අගමැති/මැතිනිය ඉවත් කිරීම තවත් විකල්පයකි. එසේත් නැත්නම් ඇමති මණ්ඩලයෙන් නියමිත සංඛ්‍යාවක් එක් වාරයකදී ඉවත් කළ හැකි ය. සමහර ව්‍යවස්ථාවලින් තවත් පියවරක් පෙරට තබා ඇත. එනම් අගමැති ඉවත් කිරීමේ යෝජනාව සමග නව අගමැති වරයකු යෝජනා කිරීමයි. (ජර්මනිය, හංගේරියාව, ලිසෝතෝ, පෝලන්තය,

ස්පාඤ්ඤය) ඒ හේතුවෙන්, විශ්වාසභංග යෝජනාවකින් අමාත්‍ය මණ්ඩලය ඉවත් කිරීමට හෝ නව මැතිවරණයක් හෝ පැවැත්වීමට හෝ ඉබේම බලපෑමක් සිදු නොවේ. ඒ වෙනුවට විකල්පය අනුප්‍රාප්තිකයකුට එකඟ නැත්නම් අගමැති තවදුරටත් සුළුතර ආණ්ඩුවක නායකයා හැටියට බලයේ සිටිය හැකි ය. ද්විත්ව විධායක ක්‍රමයකදී නම් (පෝලන්තය) නිර්මාණාත්මක විශ්වාසභංග යෝජනාවක ප්‍රතිඵල දෙකක් ඇතිවිය හැකි ය. අගමැති/අමාත්‍ය මණ්ඩලය මූලිකව පත් කිරීමට ජනාධිපතිට අවස්ථානුකූල ඉඩක් පෑදෙනු ඇත. අනික් අතට විශ්වාස භංග යෝජනාවෙන් පසු අලුත් ආණ්ඩුවක් පිහිටුවීමේ ක්‍රියාවලියෙන් ජනාධිපති කොන් කරනු ලැබීම ය.

### 5.3.4 ව්‍යවස්ථාදායකය විසුරුවා හැරීම.

විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ සම්බන්දතාව තීරණය කිරීමේදී, ඡන්දයෙන් තෝරා ගනු ලැබූ සභාවක් විසුරුවා හැරීමට ජනාධිපතිට ඇති බලය තවත් ගැටලුවකි. එම බලය නිසා ව්‍යවස්ථාදායකයට මැතිවරණයෙන් ලැබී ඇති කාලය කෙටිවේ. එම විසුරුවීමේ බලය සැලසුම් කර ඇති ආකාරය අනුව එය බලය සමබරතාවය කෙරෙහි සෑහෙන බලපෑමක් කරයි. ද්විත්ව විධායකය සැලසුම් කිරීමේදී ආර්ථාන්විත සීමා කිරීම් නොයෙදුවොත් ජනාධිපතිට, ව්‍යවස්ථාදායකයේ කැමැත්ත නැතිව ආණ්ඩුවක් පත්කළ හැකිවනු ඇත. එසේම ව්‍යවස්ථාදායකය විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒමට සැරසුනොත් සභාව විසුරුවා හරින බවට තර්ජනය කළ හැකි ය. එමගින් විශ්වාස භංග යෝජනාවට කලින් එය වැළැක්විය හැකි ය. තවද මැතිවරණ කාලසීමාව, තම දේශපාලන වැඩ සටහන උදෙසා, විසුරුවා හැරීමේ බලය භාවිත කළ හැකි ය. ව්‍යවස්ථාදායකය විසින් ආණ්ඩුවේ නායකත්වය තෝරා ගැනීමේ ආණ්ඩුක්‍රමයන්හිදී, විසුරුවා හැරිමේ බලය, පක්ෂ ඡන්ද වැඩිපුර ලබාගෙන නැවත

තනතුරට පත්වීමේ උපාය මෙවලමක් ලෙස භාවිත කළ හැකිය. උදාඃ ජපානයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය, අගමැති මැදිහත් වීමෙන් ඕනෑම මොහොතක විසුරුවා හැරිය හැකි ය. (එය අධිරාජයාගේ උපාචාරාත්මක ක්‍රියාවකට පසුය.) එහෙත් එසේ කළ හැක්කේ වසර හතරහමාරකට පසු ය. එසේ විසුරුවා හැරුණේ වසර 60 කට පසු එක් වරක් පමණි. අනෙක් සියලුම ව්‍යවස්ථාදායකයන් නියමිත කාල සීමාවට පෙර විසුරුවා ඇත.

ඉහත සඳහන් බොහෝ අභියෝග මධ්‍යයේ සමහර ව්‍යවස්ථාවන්ගෙන් ජනාධිපතිට පාර්ලිමේන්තු විසිරවීමේ බලතල ලබා දී ඇත්තේ යම් අතිරේක සීමාවන්ට යටත්ව ය. එම සීමා බොහෝ විය හැකි අතර විසුරුවීමේ කාල සීමාවක් පැනවීම එකකි. (පෘතුගාලයඃ මැතිවරණ මාස 6 කට පෙර එසේ කළ නොහැකිය.) නිතර සිදුකළ නොහැකි බවට සීමාව (ප්‍රංශය ඃ අවුරුද්දකට වරක් පමණි.) ගැබොන්හි (වර්ෂයකට වරක් වුවත් ජනාධිපති ධුර කාලයකට දෙවරකි.) විසුරුවා හැරීමට හේතුව (ඔස්ට්‍රියාව ඃ එකම හේතුව මත එක් වරකි.,පාර්ලිමේන්තු ක්‍රියාවක් පූර්ව අවශ්‍යතාවක් ලෙස මෝසම්බික්, පෝලන්තය). සමහර රටවල පාර්ලිමේන්තුව විසුරුවා හළ විට ජනාධිපතිවරණයක්ද පැවැත්විය යුතු ය. (නම්බියාව), තවත් රටවල ජනාධිපතිට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ ඒ සඳහා ජනමත විචාරණයකින් අනුමත කළොත් ය. (ඊජිප්තුව2005).

### 5.3.5. දෝෂාභියෝගය

විධායකය පාලනය කිරීමට යොදා ගැනෙණ තවත් ක්‍රමයක් වන්නේ දෝෂාභියෝගයයි. දේශපාලන ක්‍රියාමාර්ගයක් වු විශ්වාස භංග යෝජනාව සමග සසඳන විට, ව්‍යවස්ථාදායකය විසින් විධායකයට එල්ල කරන දෝෂාභියෝගය මගින් විධායක ප්‍රධානියා ඉවත් කරනු ලබන්නේ ඔහු හෝ ඇය විසින් කරන ලද නීතිමය

වැරදි පදනම් කරගෙන ය. ජනාධිපති ක්‍රමයන්හි විධායක ප්‍රධානියා ඉවත් කිරීම ආයතනික සැලසුමක් නොවන විට යෙදෙන්නේ දෝෂාභියෝගයයි. එහිදී කරුණු දෙකක් ගැන සැලකිය යුතු ය. දෝෂාභියෝග ක්‍රියාමාර්ගයකට මුල පිරිය හැකි වැරදි වල ස්වභාවය එකකි. අනික් කොටස් එම ක්‍රියා පටිපාටියට මැදිහත්වීම අනික ය. සමහර ව්‍යවස්ථාවන් අනුව දෝෂාභියෝග යෝජනාවක් ගෙන ආ හැකි වන්නේ බරපතල වරදකට ය. උදාඃ දේශද්‍රෝහී වීම, තවත් ව්‍යවස්ථාවන්හි එය පුළුල් හේතුවක් මත කළ හැකිය. උදාඃ ධූර කාලය තුළ ආ.ක්‍ර. ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම. (හංගෙරියාව) ටැන්සානියාව ඒ සම්බන්ධ අන්තවාදී උදාහරණයකි. ජනාධිපතිධූරයට නොගැලපෙන අගෞරවනීය හැසිරීම වුවද දෝෂාභියෝගයට ප්‍රමාණවත් ය. එ තරම් අපැහැදිලි සහ අතිශය පුළුල් හේතුවක් දේශපාලන අවියක් විය හැකිය. විශේෂයෙන් ඒ සම්බන්ධ තීරණය ව්‍යවස්ථාදායකය විසින් ගන්නා විට ය. (උදාඃ මෝල්ඩොවා). කෙසේ වෙතත් මෙහිදී අධිකරණය ගේට්ටු මුර කරුවාගේ කාර්යය කරනු ඇත. එනම්, ජනාධිපතිගේ හැසිරීම ව්‍යවස්ථාවට ගැලපේදැයි තීන්දු කිරීමේදී හෝ ඒ පිළිබඳ පරීක්ෂණ කමිටුවට සහභාගිවීමේදී ය. හොන්ඩියුරාස් හි විශේෂ වු ප්‍රවේශයක් යොදා ඇත. ජනාධිපති ව්‍යවස්ථාව අපකීර්තියට පත් කරන්නේ නම්,- වෙනත් කරුණු අතර තම ධූර කාලය සම්බන්ධ වෙනස් කම් කරන්නේ නම් ව්‍යවස්ථාවේ 272(2) යටතේ හමුදාවට මැදිහත් විය හැකිය. "හමුදාව පිහිටුවා ඇත්තේ සමූහාණ්ඩු රාජ්‍යයේ භෞමික අඛණ්ඩතාවත්, ස්වෛරීත්වයත් ආරක්ෂා කිරීමට, සාමය, මහජන සාමකාමී පැවැත්ම, ව්‍යවස්ථාවේ පාලනය, නිදහස් ඡන්ද ප්‍රතිපත්ති සහ සමූහාණ්ඩුවේ ජනාධිපති ධූරයේ වෙනස්කම් කිරීමෙන් ආරක්ෂා කිරීමට ය."

### 5.3.6 පුරවැසියන් විසින් ආපසු කැඳවීම

ආයතන අභ්‍යන්තරයේ සහ ආයතනයන් අතර ආයතනික පාලනයට අමතර විධායක බලය පාලනයට තිබෙන තවත්

වැදගත් ක්‍රමවේදයක් වන්නේ ප්‍රධාන විධායක ඔහු හෝ ඇය ධූරයේ සිටියදීම පුරවැසියන් විසින් ආපසු කැඳවීමේ අයිතිවාසිකම භාවිත කිරීම ය. එසේ කිරීමේ ජාතික මට්ටමේ ක්‍රම දෙකකි. මිශ්‍ර ආපසු කැඳවීම සහ පූර්ණ ආපසු කැඳවීම ය. පසුව කී ක්‍රමය ගැන අවසාන තීන්දුව ඇත්තේ පුරවැසියන් වෙත ය. මෙය කලාතුරකින් සිදුවන ලතින් ඇමරිකා ක්‍රමයකි. (උදාඃ ඉක්වදෝරය) මිශ්‍ර ක්‍රමයේදී පුරවැසියන් සම්බන්ධ වන්නේ එක් පියවරකදී පමණි. එනම් එය ආරම්භ කිරීමේදී හෝ ජනමත විචාරණයකදී තීන්දු කිරිමේදී ය. සමහර රටවල පුරවැසියන් සහභාගි වන්නේ වැරදි කරන ලද ජනාධිපති වරයකු අත්හිටුවීමේ ක්‍රියාවලියකට ය. (රුමේනියාව). එහිදී පුරවැසියෝ දේශපාලන කතිකාවක නිරත වෙති. එහිදී ආපසු කැඳවීම අනුමත කළ යුතුය. (උදාඃ ඕස්ට්‍රියාව, අයිස්ලන්තය).

පුරවැසියන් විසින් ආපසු කැඳවීම, සහභාගිත්ව මූලධර්ම හා පලදායි ආණ්ඩුකරණය සමගත්, ආපසු කැඳවීමේ ක්‍රියා පටිපාටිය නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ආයතනත් සමග සමබර කළ යුතු ය. එක් අතකින් නිරන්තර ආපසු කැඳවීම නිසා නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යටපත් කරන අතර විධායකයේ මධ්‍ය හා දිගුකාලීන දේශපාලන වැඩ සටහන් වලට බාධාවක් වනු ඇත. අනික් අතට එම ක්‍රියාමාර්ග ඉසිලිය නොහැකි තරමට බරවන විට පුරවැසියන් මුලින් අදහස් කළ පරිදි සිය නියෝජිතයන් වෙත වගකීම පැවරීම සීමා වනු ඇත.

## 5.4 විධායකයේ ස්ථාවර බලතල සැලසුම් කිරීම

ඉහත කී පරිදි විධායකයේ බලතල කොටස් වලට බෙදා වෙන් කිරීමට අමතරව, තීරණ ගැනීමේ ක්‍රියාවලියට වෙනත් අංශවල අය යොදා ගැනීමට ව්‍යවස්ථා සම්පාදකයන් අදහස් කරනු ඇත. එහිදී විකල්ප දෙකක් ගැන සිතීම වටී. පළමුව, විධායකය පාලනය කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමයක් ලෙස

තීරණ ගැනීමට වෙනත් අය සම්බන්ධ කරගැනීම, දෙවනුව, ආණ්ඩුවේ අංශයන්හි වෙනත් ස්ථාවර බල මණ්ඩල කෙරෙහි විධායක බලය සීමා කිරීම ය.

**5.4.1 ස්ථාවර විධායක තීන්දු ගැනීමේ ක්‍රියාවලියට වෙනත් ක්‍රියා කාරීන් මැදිහත් වීම.**

පළමු වර්ගය- විධායක අධිකාරීත්වය ලිහිල් කිරීම - හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කිරීමේ තීන්දු ගැනීම, ක්ෂමා ප්‍රදානය, හෝ යුද්ධ ප්‍රකාශ කිරීම වැනි දේ ඊට ඇතුළත් විය හැකි ය. දෙවැනි වර්ගය - සාම්ප්‍රදායිකව ව්‍යවස්ථාදායකය විසින් විධායකය වෙත බලපෑම් කිරීමේ තීන්දු වෙන්කර තැබීම. උදාඃ විධායකයට යම් පනතක් හෝ නියෝගයක් පැනවීමට ඇති නීතිමය බලය සීමා කිරීම, නීති පැනවීමේ විධිමත් ක්‍රියාවලිය විධායකයට චුවමනා පරිදි සැකසීම වැලැක්වීම.

**හදිසි අවස්ථාව.**

හදිසි අවස්ථාවක් කවුරුන් විසින් ප්‍රකාශ කරන්නේද , එය සිදු කරන්නේ කුමන ආකාරයෙන්ද යන ව්‍යවස්ථානුකූල ප්‍රශ්න විධායකය හැර අනෙක් ආයතන කෙරෙහි විවිධ මට්ටමින් සම්බන්ධ වෙයි. ව්‍යවස්ථාවෙන් එම අවස්ථා නිරූපනය කොට දැක්වියහැකිය. - එවැනි අවස්ථා පමණි. එනම් ස්වභාවික ව්‍යවසනයක් ඇතිවූ අවස්ථාවකදී ය. එහෙත් ව්‍යවස්ථා සම්පාදකයන් අභිමතය ක්‍රියාත්මක කිරීමේ ඉඩක් තැබිය හැකිය. එනම් අභ්‍යන්තර සාමයට හා මහජන සෞඛ්‍යයට තර්ජනයක් ඇති වු අවස්ථා ය. එබඳු සෑම අවස්ථාවක්ම සඳහන් කිරීම නුවණට හුරු නොවේ. තර්ජනාත්මක සිද්ධියක් හදිසි අවස්ථාවක්ද යනු යම් කෙනෙකු තීරණය කළ යුතු ය. එසේම එම අවස්ථාවෙන් අනිසි ප්‍රයෝජන ගැනීම වැළැක්වීමට එම තීරණය නිවැරදිදැයි තවත් කෙනකු විසින් විමර්ශනය කළ යුතු ය.

පේරු රාජ්‍යයේ ව්‍යවස්ථාව අනුව ප්‍රධාන විධායක විසින් හදිසි තත්වය ප්‍රකාශ කිරීමට පෙර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය. එය විධායකය තුළම බලතල බෙදීමකි. මාලදිවයේ ව්‍යවස්ථාව අනුව විධායකට හදිසි අවස්ථාවක් ප්‍රකාශ කළ හැකිය. නමුත් නියමිත කාලසීමාව තුළදී පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු ය. ඉතියෝපියාවේ සහ ෆීජිව්‍යවස්ථාව අනුව හදිසි අවස්ථාව ප්‍රකාශ කිරීමට පෙර පාර්ලිමේන්තුවේ සම්මතිය අවශ්‍යවේ. මොංගෝලියා ව්‍යවස්ථාවේ පරිදි හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කළ හැක්කේ පාර්ලිමේන්තුවට පමණි. එය පුළුල්තම බලතල බෙදා හැරීම ය. ජනාධිපති එය කළ හැකිවන්නේ පාර්ලිමේන්තුව නිවාඩු ගොස් ඇති විට ය. එහෙත් එය දින හතකට පමණි.

අන් කිසිම විධාවක ක්‍රියාවකට වඩා හදිසි අවස්ථාව ප්‍රකාශ කිරීම මගින්, ඒක පාක්ෂික ක්‍රියාවකට පැනවෙන බාධාවන් වළක්වා ගත හැකි ය. මේ හේතුවෙන් පශ්චාත් ගැටුම් රටවල හදිසි අවස්ථා වලංගු වීමට පූර්ව අවශ්‍යතා දක්වා ඇත. එහෙත් සැබෑ හදිසි අවස්ථාවක් පැමිණි විට පූර්ව අවශ්‍යතාවලට අවනත වීම අසීරු විය. හැකි ය. උදාඃ හයිටි රාජ්‍යයේ හදිසි අවස්ථාව ප්‍රකාශ කිරීමට අගමැති ඇතුළු ඇමති මණ්ඩලය ඊට අත්සන් කළ යුතු ය. හයිටියේ මෑතකදී ඇති වූ භූමිකම්පාවෙන් ඇමතිවරුද කීප දෙනෙක් මිය ගියහ. එහිදී ව්‍යවස්ථා ප්‍රතිපාදන ද, නීතියේ ආධිපත්‍යයද නොතකා රටේ ස්වෛරීත්වය වෙනුවෙන් නීති පැනවීමට ජනාධිපතිට සිදුවිය.

**පොදු සමාව දීමේ බලය**

විධායකය විසින් සාම්ප්‍රදායිකව භාවිත කරන අනෙක් අවස්ථාව වන්නේ පොදු සමාව දීමේ බලයයි. පශ්චාත් ගැටුම් පසුබිම් වලදී සංක්‍රාන්තික යුක්තිය ඉටු කිරිමේ

සාධකය ලෙස සමාව දීමේ වගන්ති ව්‍යවස්ථාවන්ට ඇතුළත් කරනු ලබන නව සාමකාමී යුගයක් ඇරඹීමේ පූර්ණ අවශ්‍යතාවයක් වශයෙනි. මෙහිදී සංක්‍රාන්තික යුක්තියේ අවශ්‍යතාව ගැන නොව සාමාන්‍ය ව්‍යවස්ථාමය කරුණක් වශයෙන් සමාව ගැන සලකා බැලේ. එසේ වුවද පොදු සමාව දීම යන කාරණය සංවේදී වන බැවින් අදූරදර්ශීව භාවිත කළොත් යුක්තිය පසිඳලීමේ කාර්යය කෙරෙහි බෙහෙවින් බලපායි. එහෙයින් එම ක්‍රියාවට මූලික වන අය සම්බන්ධයෙන් නිසි සමබරතාවක් තිබීම අතිශය වැදගත් ය. මේ සඳහා විවිධ ව්‍යවස්ථාමය විකල්පයන් යොදා ගැනේ. ඒ අතර පොදු සමාව දීමේ තනිබලය විධායකයට පැවරීමේ සිට (බුර්කිනාෆාසෝ, චෙක් සමූහාණ්ඩුව) සමාන සමාවක් දීම දක්වා වෙයි. (ජෝර්ජියාව, කෙන්යාව) තවද පොදු සමාව දීමෙන් විධායකය මුළුමනින් ඉවත් කිරිමද වෙයි. (හංගේරියාව) මේ අන්ත දෙක අතර එම බලය විධායකය සහ ව්‍යවස්ථාදායකය යන සමාන්තරන බලය යෙදෙනු ඇත. (මොසැම්බික් 1990) සීමිත අවස්ථාවලදී පමණක් සමාව දීම, (හයිටි) විධායකය සහ ව්‍යවස්ථාදායකය ඒකාබද්ධව සමාව තීන්දු කිරීම, (ඉන්දුනීසියාව, දකුණු කොරියාව) සිදුවේ. ග්‍රීසියේ පොදු සමාවක් දිය හැක්කේ දේශපාලන වැරදි වලට, ආයතන දෙකම අනුමත කළොත් පමණි.

## 5.4.2 නීති හැදීමේදි විධායකයේ බලපෑම සීමා කිරීම.

සම්ප්‍රදායානුකූලව, නීති හැදීමේ බලය ඇත්තේ ව්‍යවස්ථාදායකයට මිස විධායකයට නොවේ. ආණ්ඩුවේ මූලික අංශයන්හි එනම් නීති හැදීමේ ආයතනය වැනි ඒවාට බලපෑම් කිරීම, බාධා කිරීම, පාලනය කිරීම, සඳහා විධායකය බලය සැලසුම් කිරීමේදී එයින් නීති හැදීම කෙරෙහි බලපෑම් කළ හැකි ප්‍රමාණය ගැන සිතා බැලිය යුතුය. ඒ අනුව නීති හැදීමේ ක්‍රියාවලියට විධායකයට සම්බන්ධ විය හැකි ආකාර දෙකක් දක්වා ඇත. (අ) ප්‍රකාශයක් මගින් නීතියක් පැනවීමේ

බලය, (ආ) ව්‍යවස්ථාදායකයේ නීති හැදීමේ ක්‍රියාවලියට සම්බන්ධ වීම.

**ප්‍රකාශයක් නීතියක් පැනවීම.**

මෙය නියාමක හා පරිපාලන ප්‍රකාශන සමග පටලවා නොගත යුතුය. බොහෝ විධායකයන්, විශේෂයෙන් මහජන ඡන්ද කටයුතු කිරීමට ප්‍රකාශ නිකුත් කිරීමට නැඹුරු වනු ඇත. සමහර අවස්ථාවන්හිදී, නීති හැදීමේ ව්‍යවස්ථාදායක අභිලාශය අර්ථකථනයට පුළුල් අභිමතයක් ජනාධිපතිට ඇත. ප්‍රකාශයකින් නීති හැදීම ආකාර දෙකකි. : (අ) ව්‍යවස්ථාදායකයෙන් පැරුනු බලතල, (ආ) මූලික ව්‍යවස්ථාවෙන්ම පැවරුනු බලතල යනුවෙනි. ඉහත සඳහන් පළමුවැන්නේදී ව්‍යවස්ථාදායකය විසින් ම එසේ පැවරුණු බලතල අවලංගු කිරීම, (ක්‍රොඒෂියාව). ව්‍යවස්ථාදායකයේ බහුතර ඡන්දයෙන් මෙම බලය පවරා ඇත්නම් හා එහි අර්ථ සීමා කොට දක්වා ඇත්නම්, එම විශේෂිත ප්‍රදේශය සම්බන්ධයෙන් පුද්ගලයාට එරෙහිව ක්‍රියා කළ හැකි ය. නීති හැදීමේ බලය කෙලින්ම පැවරී ඇතිවිට සලකා බැලිය යුතු පැති දෙකක් වේ. පළමුව, අසාමාන්‍ය අවස්ථාවන්හිදී නීති පැනවීමේ බලය, දෙවනුව විශේෂ කරුණක් සම්බන්ධයෙන් නීති පැනවීමේ බලය. මෙවැනි ව්‍යතිරේදීය අවස්ථා බොහෝවිට ඇතිවන්නේ ව්‍යවස්ථාදායකය රැස් නොවන කාලයකදී ය. කෙසේ වෙතත් එසේ ප්‍රකාශ කළ නීති නියෝග යම් කාලයක් තුලදී ව්‍යවස්ථාදායකය සම්මත නොකළොත් අහෝසිවේ. (උදා: බ්‍රසීලය). තවත් ව්‍යතිරේකයක් වන්නේ හදිසි අවස්ථාවකි. මෙවැනි වගන්ති පරිස්සමින් සැලසුම් නොකළහොත් එවැන්නක් ව්‍යවස්ථාදායකයට වුවද පුළුල්ව අනිසි ලෙස භාවිත කළ හැකි ය. එය ඊජිප්තුව, සූඩානය හා තවත් රටවල සුදුවිය.

අනෙක් අතට, නීතිමය බලය ඇති ප්‍රකාශ නිකුත් කිරීමට විධායකයට ව්‍යවස්ථාවෙන් ම බලය පැවරිය හැකි ය. ඒ

යම් විශේෂ ප්‍රතිපත්ති කාරණා සම්බන්ධයෙනි. ඒ අයුරින් ව්‍යවස්ථාදායකය වුවද ඒ විශේෂ කරුණු වලදී අවනත කරගත හැකිවනු ඇත.

**විධායකය නීති සෑදීමේ ක්‍රියාවලියට මැදිහත්වීම.**

ව්‍යවස්ථා පැනවීමේ ක්‍රියාවලියට විවිධ අවස්ථා ඇත. නීතියේ ආරම්භයේ සිට කෙටුම්පතක් නීතියක් බවට පත්වීම දක්වා ය. මෙම ක්‍රියා වලියේ දී ස්ථාවර විධායකයේ මැදිහත්වීම අවස්ථා දෙකකි.-(අ) මූලාරම්භය (ආ) ව්‍යවස්ථාදායකය පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් පසු.

**(අ) නීති පැනවීමේ ආරම්භය**

සියලුම කරුණු සම්බන්ධයෙන් නීති සෑදීමේ අසීමිත අධිකාරිත්වය ව්‍යවස්ථාවෙන්ම ව්‍යවස්ථාදායකයට පැවරී ඇත. සමහර විට තනිකරම එයට පමණක් පැවරේ. (උදාඃ ඇ.එ.ජ). බොහෝ රටවල කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ බලය විධායකයන් හවුල් කරගෙන කරනු ඇත. සමහර ව්‍යවස්ථාවන්හි අය වැය නීති රීති ගෙන ඒමේ විශේෂ බලය සහ අන්තර් ජාතික සම්මුති, වානිජ හා තීරුබදු නීති විධායකයට පැවරී ඇත. මෙම අධිකාරය සමහර ප්‍රතිපත්ති පිළිබඳව ද පැවරෙන අවස්ථා ඇත. (උදාඃ බ්‍රසීලය, චිලීය, කොලම්බියාව). මෙබඳු ගේට්ටු මුරකරු, ක්‍රියාවලියක් විධායකයට ප්‍රතිපත්ති කරුණු සම්බන්ධයෙන් තම තරාතිරම පවත්වා ගත හැකි ය. විපක්ෂය විසින් ආධිපත්‍යය දරන ව්‍යවස්ථාදායකයන් වෙනස්කම් ඇති කිරීමට නීති පැනවීම වැළැක්වීමට එම බලය යෙදිය හැකි ය.

**(ආ) ජනාධිපතිගේ නිෂේධ බලය**

ව්‍යවස්ථාදායකයෙන් කෙටුම්පතක් සම්මත කළ පසු එය කෙරෙහි බලපෑම් කිරීමට, බාධා කිරීමට, වැළැක්වීමට

බොහෝ ව්‍යවස්ථා වලින් ජනාධිපතිට බලය දී ඇත. එසේ නිෂේධ බලය ව්‍යවස්ථාවලින් අර්ථ කථනය කිරීම තුළට බලය කැටිකර ගැනීම හෝ බලය බෙදා හැරීම ඇතුළත් විය හැකි ය. ජනාධිපතිගේ මැදිහත් වීම ආකාර දෙකකින් හඳුනාගත හැකිය. (අ) දේශපාලන හේතුමත කෙලින්ම කෙටුම්පත ප්‍රතික්ෂේප කළ හැකි ය. (ආ) කෙටුම්පතේ ව්‍යවස්ථානුකූල භාවය ප්‍රශ්න කළ හැකි ය. පළමුවැන්න දේශපාලන නිෂේධ බලයයි. දෙවැන්න, ව්‍යවස්ථානුකූභාවය පිළිබඳ නිෂේධ බලය වේ. ජනාධිපති හෝ අර්ධ ජනාධිපති මහජව ඡන්දයෙන් තෝරා ගනු ලබන ක්‍රමයන්හි දේශපාලන නිෂේධ බලය යෙදීම සාමාන්‍ය සිදුවීමකි. බහුතරයක් විසින් යෙදූ නිෂේධ බලයක් ව්‍යවස්ථාදායකයට පරාජය කළ හැකිනම්, එය මුලින් කෙටුම්පත සම්මත කළ බහුතරයන් ඉක්මවා යන එකකි. (උදාඃ බොට්ස්වානා, ඉන්දියාව, තුර්කිය). එවිට ජනාධිපතිගේ නිෂේධ බලය දුර්වලය. එවින් ලැබිය හැක්කේ ප්‍රමාද කිරීමේ අයිතිවාසිකම පමණි. එනම්, යළිත් ව්‍යවස්ථාදායකය එම කෙටුම්පත සලකා බැලීමට පෙර මාස කීපයක් නිෂේධ බලය නිසා ගතවනු ඇත. එම කාලය එය නැවත මහජන අදහස් වලටත්, මාධ්‍ය අවධානයටත් යොමුවනු ඇත. (උදාඃ උරුගුවේ) නිෂේධ බලය නිෂ්ප්‍රභ කිරීමේ ව්‍යවස්ථාදායකය ආරම්භකත්වය වැඩිවන විට ජනාධිපතිගේ නිෂේධ බලය වඩා ස්ථාවර වනු ඇත. ආරම්භකතාව වැඩිවන පමණට පරම බහුතරයක් සිට, (පේරු රාජ්‍යය). සියයට 60 දක්වා වෙනස් විය හැකි ය. (පෝලන්තය). සියයට 67 දක්වා චිලීයේ වෙනස් විය. ස්‍යවස්ථාදායකයේ සම්පූර්ණ සාමාජිකත්වය දක්වාද වෙනස් විය. (ඊජිප්තුව). ව්‍යවස්ථාදායකයේ සංයුතිය හා විපක්ෂයේ ශක්තිය අනුව ජනාධිපතිගේ නිෂේධ බලය, යථාර්ථ වශයෙන් පරම නිෂේධ බලයකට පවතින්නේ කලාතුරකිනි. එසේ පවතින විට එය බලපාන්නේ සීමිත ප්‍රතිපත්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙනි. (උදාඃ සයිප්‍රස්).

ඉහත සඳහන් නිෂේධ බල පැකේජයට අමතරව ජනාධිපතිට ඔව් හෝ නෑ යනුවෙන් මත විමසීමේ බලයද පවරා ඇත. එය අර්ධ නිෂේධ බලයක් වු එමගින් කෙටුම්පතක යම් කොටස් වලට විරෝධය දැක්විය හැකිය. නීති විස්තරයට අතුරු හදිසි ප්‍රකාශයක් බල ගැන්වීමෙනි. එම සීමිත මැදිහත්වීම සමුච්චිතව අවසාන නීති සැලසුමට මහත් බලපෑමක් කිරීමට ඉඩ සලසයි.

තවත් විකල්පයක් වන්නේ, යෝජිත නීතියක් සම්මත කිරිමට ජනපති විසින් පුළුල් අනුමතියකට යොමු කිරීම ය. විධායකය විසින් ව්‍යවස්ථාදායකය වෙත බලපෑම් කිරීම සඳහා කෙටුම්පත අනුමත කිරිම හෝ ප්‍රතික්ෂේප කිරීමට බහුතර ඡන්දයක් ලබා ගැනීමට සැලසිය හැකි ය. (ප්‍රංසය සහ පේරු). තම ප්‍රතිපත්ති යෝජනාව ඉදිරියට ගෙන යාම සඳහා ජනපතිට හෝ ජනාධිපතිනියකට ඇති වැදගත් මෙවලමක් වන්නේ ජනමතයක් කැඳවීමේ බලයයි. කෙටුම්පතක අන්තර්ගතය පිළිබඳ විවාදයකින් පසු ජනාධිපතිවරුන් /වරියන් විසින් තමන්වෙත ඇති ජනබලය හා වලංගුතාව එමගින් යළි සහතික කරගත හැකි ය.

එසේම කෙටුම්පතක ව්‍යවස්ථානුකූල භාවය අභියෝගයට ලක් කිරීම, සඳහා එය නිසි අධිකරණ විමර්ශනයට යොමු කිරීමේ බලය ජනාධිපතිට /පතිනියට ව්‍යවස්ථාවෙන්ම පැවරී තිබිය හැකිය. (ක්‍රොඒෂියාව, දකුණු අප්‍රිකාව). මෙහිදී නීතියක ව්‍යවස්ථානුකූභාවය පිළිබඳ ජනාධිපතිගේ /පතිනියගේ සැලකිල්ලෙන් නීතියේ ප්‍රමාදයක් - එය නිසි අධිකරණ විමර්ශනයට යොමු වීමෙන් - ඇතිවන අතර එහි දේශපාලන හේතු වෙනුවට නෛතික ක්‍රියාවලිය අවසන් වෙයි. ජනධපති කෙනෙකුට කෙටුම්පතක් කෙරෙහි නිෂේධ බලය යෙදීමට ඉඩ සැලසීමෙන් මුල් අවස්ථාවේදීම එය අධිකරණ සෝදිසියකට ලක්වීම සිදුවේ.

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05

දුරකථන : 011 2370803 / 4

ෆැක්ස් : 011 2370801 / 2

වෙබ් අඩවිය : www.cpalanka.org

ඊමේල්: info@cpalanka.org



ISBN : 978-955-4746-60-2